WWW.ALEVELAPI.COM

NEW


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 09 - ජීව විද්‍යාව

## නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2020
## 09 - ජීව විද්‍යාව - නව නිර්දේශය

### ලකුණු බෙදී යන ආකාරය

I පත්‍රය - **1 x 50** = 50

II පත්‍රය

**A** කොටස - ව්‍යුහගත රචනා (ප්‍රශ්න හතරට ම පිළිතුරු සැපයිය යුතුය)

| | | | |
|---|---|---|---|
| ප්‍රශ්න අංක | 01 | - | 100 |
| ප්‍රශ්න අංක | 02 | - | 100 |
| ප්‍රශ්න අංක | 03 | - | 100 |
| ප්‍රශ්න අංක | 04 | - | 100 |

100 x 4 = 400

**B** කොටස - රචනා (ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතුය)

| | | | |
|---|---|---|---|
| ප්‍රශ්න අංක | 05 | - | 150 |
| ප්‍රශ්න අංක | 06 | - | 150 |
| ප්‍රශ්න අංක | 07 | - | 150 |
| ප්‍රශ්න අංක | 08 | - | 150 |
| ප්‍රශ්න අංක | 09 | - | 150 |
| ප්‍රශ්න අංක | 10 | - | 150 |

150 x 4 = 600

මුළු ලකුණු = 400 + 600 = 1000

**II පත්‍රය අවසාන ලකුණු** = 100



Visit EDUHUB විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමා කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කො අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ...................................................... √ $\frac{4}{5}$

(ii) ...................................................... √ $\frac{3}{5}$

(iii) ...................................................... √ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මඟ සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපය ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලඳ කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉ අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතු ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මෑ ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතු ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළ ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව ලියන්න.



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය.
I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.
51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

www.alevelapi.com



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

WWW.ALEVELAPI.COM



[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ජීව විද්‍යාව I
உயிரியல் I
Biology I

09 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි** අදාළ **නිවැරදි අංකය මත කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** පෘථිවිය මත මුලින් ම ඇති වූ ජීවීන් ලෙස සැලකෙන්නේ
(1) විෂමපෝෂී, නිර්වායු සූන්‍යෂ්ටිකයන් ය.
(2) විෂමපෝෂී, ස්වායු ප්‍රාග්න්‍යෂ්ටිකයන් ය.
(3) ස්වයංපෝෂී, නිර්වායු සූන්‍යෂ්ටිකයන් ය.
(4) විෂමපෝෂී, නිර්වායු ප්‍රාග්න්‍යෂ්ටිකයන් ය.
(5) ස්වයංපෝෂී, ස්වායු ප්‍රාග්න්‍යෂ්ටිකයන් ය.

**2.** ප්‍රෝටීන
(1) ඩයිසල්ෆයිඩ බන්ධන නිසා ද්විතීයික ව්‍යුහය ඇති කර ගනී.
(2) විවිධ ඇමයිනෝ අම්ල 26කින් සමන්විත වේ.
(3) C, H, O, N, S සහ P වලින් සමන්විත ය.
(4) ක්ෂාලක නිසා ද්‍රස්වභාවීකරණය නොවේ.
(5) ද්‍රව්‍ය පරිවහනයට දායක වේ.

**3.** වීදුරු කදාවක් මත නැංවූ ඇණු සිවියක් සංයුක්ත ආලෝක අණ්වීක්ෂයක වේදිකාව මත තබා නිරීක්ෂණය කිරීමේ පියවර පහත දැක්වේ.
A - දර්පණය සකස් කිරීම
B - සියුම් සීරුමාරුව භාවිත කිරීම
C - දළ සීරුමාරුව භාවිත කිරීම
ඉහත පියවරවල නිවැරදි අනුපිළිවෙළ වන්නේ
(1) A, B සහ C ය.
(2) A, C සහ B ය.
(3) B, A සහ C ය.
(4) C, A සහ B ය.
(5) C, B සහ A ය.

**4.** සෛලවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - ප්ලාස්ම පටලය තිබීම
B - 70S රයිබොසෝම තිබීම
C - අනූනන විභාජනය සිදු වීම
D - සයිටොසොලය තුළ අවලම්බනය වූ උපසෛලීය සංඝටක තිබීම
ඉහත සඳහන් ලක්ෂණ අතුරෙන් ප්‍රාග්න්‍යෂ්ටික සහ සූන්‍යෂ්ටික සෛලවලට පොදු වන්නේ මොනවා ද?
(1) A සහ B පමණි.
(2) B සහ C පමණි.
(3) B සහ D පමණි.
(4) A, B සහ C පමණි.
(5) A, B සහ D පමණි.



Visit EDUHUB සියලු ම විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

5. සුන්‍යෂ්ටික සෛල චක්‍රය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
   (1) අපසාරණය සිදු වන්නේ ඌනනය I හි යෝග කලාවේදී ය.
   (2) ක්‍රොමැටින් තැනෙනුයේ $G_1$ කලාවේදී ය.
   (3) DNA ප්‍රතිවලිත වීම සිදු වන්නේ $G_2$ කලාවේදී ය.
   (4) න්‍යෂ්ටික ආවරණය නැවත තැනෙනුයේ සෛල ප්ලාස්ම විභාජනය සිදු වන විටදී ය.
   (5) අනුනන තර්කුව තැනීම ආරම්භ වන්නේ ප්‍රාක් කලාවේදී ය.

6. ATP
   (1) පෙන්ටෝස් සීනි, ඇඩිනීන් සහ පොස්ෆේට් කාණ්ඩවලින් සමන්විත නියුක්ලියොසයිඩයකි.
   (2) සූර්ය ශක්තිය භාවිත කර ඔක්සිකාරක පොස්ෆොරයිලීකරණය මගින් නිපදවිය හැකි ය.
   (3) 30.5 kJ/mol ශක්ති ප්‍රමාණයක් නිදහස් කරමින් ADP බවට ජලවිච්ඡේදනය වේ.
   (4) උපස්තර මට්ටමේ පොස්ෆොරයිලීකරණය හරහා පයිරුවේට් ඔක්සිකරණයේදී නිපද වේ.
   (5) ඩිඔක්සිරයිබෝස් දරයි.

7. පහත සඳහන් ඒවා අතුරෙන් එන්සයිමවල ලක්ෂණයක් වන්නේ කුමක් ද?
   (1) ඒවා අන්ත ඵලවල ස්වභාවය වෙනස් නොකරයි.
   (2) ඒවා ප්‍රතික්‍රියාවක සක්‍රියන ශක්තිය වැඩි කරයි.
   (3) ඒවා උපස්තරවලට විශිෂ්ට නොවේ.
   (4) ප්‍රතික්‍රියාවේදී එන්සයිම සුළු ප්‍රමාණයක් වැය වේ.
   (5) එන්සයිම අණුවක ඕනෑම කොටසකට ප්‍රතික්‍රියාවක් උත්ප්‍රේරණය කළ හැකි ය.

8. ජෛව රසායනික පරිණාමය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දී ඇත.
   P - ඇමයිනෝ අම්ල සහ නයිට්‍රජනීය භෂ්ම වැනි කුඩා කාබනික අණු ප්‍රථමයෙන් ම ආදි සාගරවල ඇති විය.
   Q - කුඩා කාබනික අණු, කාබනික මහා අණු තැනීම සඳහා බහුඅවයවීකරණය විය.
   R - ප්‍රාක්සෛල තුළ පටලවලින් වට වූ න්‍යෂ්ටික අම්ල තිබුණි.

   ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
   (1) P පමණි. (2) Q පමණි. (3) P සහ Q පමණි.
   (4) Q සහ R පමණි. (5) P, Q සහ R.

9. ජීවීන්ගේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

| සෛලීය සංවිධානය | පෙප්ටිඩොග්ලයිකෑන් | RNA පොලිමරේස් | ස්ට්‍රෙප්ටොමයිසින් සඳහා ප්‍රතිචාරය |
|---|---|---|---|
| A – ප්‍රාග්න්‍යෂ්ටික | P – ඇත. | R – එක් ආකාරයකි. | X – වර්ධනය නිෂේධනය වේ. |
| B – සුන්‍යෂ්ටික | Q – නැත. | S – ආකාර කිහිපයකි. | Y – වර්ධනය නිෂේධනය නොවේ. |

   පහත දී ඇති එක් එක් ජීවියා සඳහා ඉහත ලක්ෂණවල නිවැරදි සංකලනය දක්වන ප්‍රතිචාරය තෝරන්න.
   (1) *Nostoc* – A, P, S, X
   (2) *Thermococcus* – A, P, R, Y
   (3) *Euglena* – B, P, S, X
   (4) *Mucor* – B, Q, S, Y
   (5) *Planaria* – B, Q, R, Y

10. සතුන් අතර දැකිය හැකි ව්‍යුහ කිහිපයක් පහත දැක්වේ.

    ප්‍රාක් වෘක්කිකා, ප්‍රාවරණය සහ දංශක සෛල

    ඉහත සඳහන් එක් එක් ව්‍යුහය දක්වන ජීවීන් පිළිවෙළින්
    (1) *Obelia*, කොකු පණුවා සහ *Fasciola* වේ.
    (2) *Planaria*, හම්බෙල්ලා සහ ලොඩියා වේ.
    (3) *Taenia*, කිරිපණුවා සහ *Obelia* වේ.
    (4) *Fasciola*, ගැඩවිලා සහ *Hydra* වේ.
    (5) මුහුදු කැකිරි, ගොළුබෙල්ලා සහ *Obelia* වේ.

11. හදා පාසිවලට වඩා ශුකි පාසි බීජ ශාකවලට සමාන ලෙස සැලකිය හැක්කේ, ශුකි පාසි
    (1) කඳක් දරන බැවිනි.
    (2) පත්‍ර දරන බැවිනි.
    (3) විෂමබීජාණුකතාව දක්වන බැවිනි.
    (4) සංකේතු දරන බැවිනි.
    (5) ප්‍රමුඛ බීජාණුශාකයක් දරන බැවිනි.



Visit EDUHUB විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**12.** සමහර සත්ත්වයන්ගේ ඇතිය හැකි ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - කෙරටිනීමය ශල්ක
B - අභ්‍යන්තර සංසේචනය
C - [illegible]
D - කලලීය ජීවිතය

රෙප්ටිලියා, ඇම්ෆිබියා සහ මැමේලියා යන වර්ගවලට අයත් ජීවීන්ගේ දැකිය හැක්කේ ඉහත සඳහන් කුමන ලක්ෂණ ද?

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ D පමණි.
(4) A, B සහ C පමණි. (5) A, B සහ D පමණි.

**13.** ස්ථූලකෝණාස්තර සෛල මෘදුස්තර සෛලවලින් වෙනස් වන්නේ ස්ථූලකෝණාස්තර සෛල

(1) පරිණත විට අජීවී බැවිනි.
(2) විශාල මධ්‍ය රික්තකයක් දරන බැවිනි.
(3) අසමාකාර ලෙස ඝන වූ සෛල බිත්ති දරන බැවිනි.
(4) ලිග්නින්වලින් ඝන වී ඇති බැවිනි.
(5) ශාකවල සනාල පටකවල ඇති බැවිනි.

**14.** පුරෝහ අග්‍රස්ථ විභාජකය

(1) කඳේ උස සහ විෂ්කම්භය වැඩි කරයි.
(2) ඇතුළතට සහ පිටතට සෛල නිපදවයි.
(3) මෘදුස්තර සෛලවලින් සමන්විත වේ.
(4) විභේදනය නොවූ සෛලවලින් සමන්විත වේ.
(5) කඳේ ප්‍රාථමික සහ ද්විතීයික වර්ධනයට දායක වේ.

**15.** ජලයේ ද්‍රාව්‍ය ද්‍රවණය වීම

(1) ජල විභවය සහ ද්‍රාව්‍ය විභවය වැඩි කරයි.
(2) ජල විභවය සහ ද්‍රාව්‍ය විභවය අඩු කරයි.
(3) ජල විභවය අඩු කරන අතර ද්‍රාව්‍ය විභවය වැඩි කරයි.
(4) ජල විභවය වැඩි කරන අතර ද්‍රාව්‍ය විභවය අඩු කරයි.
(5) ජල විභවය සහ ද්‍රාව්‍ය විභවය කෙරෙහි එකිනෙකට ස්වාධීන ලෙස බලපායි.

**16.** ආසෘතිය

(1) පාරගම්‍ය පටලයක් තුළින් ජල අණු විසරණය වීම නිසා සිදු වේ.
(2) අඩු ජල විභවයක සිට වැඩි ජල විභවයකට සිදු වේ.
(3) සක්‍රිය ක්‍රියාවලියකි.
(4) පසේ සිට මූල කේශ තුළට ජලය ඇතුළු වන යාන්ත්‍රණයයි.
(5) ප්‍රභාවයේදී පෙනේර නල ඒකක තුළ පීඩනය අඩු කරයි.

**17.** මේරූ පත්‍රවල හරිතක්ෂය ඇති විය හැක්කේ පහත සඳහන් කුමන මූලද්‍රව්‍යවල ඌනතාව නිසා ද?

(1) Mg සහ S (2) N සහ P (3) Cl සහ Fe (4) Mn සහ Zn (5) Mo සහ Ni

**18.** ඵලයක බීජය විකසනය වන්නේ

(1) අණ්ඩ සෛලයෙනි. (2) මධ්‍ය සෛලයෙනි. (3) කලල කෝෂයෙනි.
(4) ඩිම්බයෙනි. (5) ඩිම්බකෝෂයෙනි.

**19.** ශාක හෝර්මෝන කිහිපයක් පහත දැක්වේ.

A - ඇබ්සිසික් අම්ලය
B - සයිටොකයිනින
C - එතිලීන්
D - ගිබරලීන

ඉහත සඳහන් හෝර්මෝන අතුරෙන් පත්‍රවල වෘද්ධතාව දිරි ගන්වන්නේ

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) C සහ D පමණි. (5) A, B සහ C පමණි.

**20.** සමබීජාණුකතාව පෙන්වන ශාක සඳහා නිදසුන් වන්නේ

(1) *Pogonatum* සහ *Nephrolepis* ය. (2) *Lycopodium* සහ *Selaginella* ය.
(3) *Selaginella* සහ *Cycas* ය. (4) *Lycopodium* සහ *Gnetum* ය.
(5) *Nephrolepis* සහ *Pinus* ය.



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

**21.** මිනිසාගේ අම්ල භස්ම සමතුලිතතාව පවත්වා ගැනීම, ස්නායු ක්‍රියාකාරිත්වය සහ අස්ථි තැනීම සඳහා ප්‍රධාන වශයෙන් ම අවශ්‍ය ඛනිජ මූලද්‍රව්‍ය පිළිවෙළින්

(1) Mg, Fe සහ P වේ. (2) P, K සහ Cl වේ. (3) K, Na සහ I වේ.
(4) Na, K සහ Cl වේ. (5) Cl, Ca සහ P වේ.

**22.** මෙම ප්‍රශ්නය පහත සඳහන් ඒවා මත පදනම් වේ.

A - වසා තරලය ගලනය වීම; හෘත් පේශි සංකෝචනය
B - ශ්වසනාලිකාවලදී වායු හුවමාරුව; සක්‍රිය පරිවහනය
C - රුධිරය කැටි ගැසීම; ත්‍රොම්බින් සෑදීම
D - රුධිරය තුළ $CO_2$ පරිවහනය; රතු රුධිරාණුවල සහභාගිත්වය

ඉහත සඳහන් යුගලවල පළමුවැන්න සඳහා දෙවැන්න දායක වන්නේ කුමන ඒවායේ ද?

(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) C සහ D

**23.** නිසල ව සිටින පුද්ගලයෙකුගේ ශ්වසන පරිමා හතරක් පහත දැක්වේ.

අතිරේක ආශ්වාස පරිමාව = 2500 ml උදම් පරිමාව = 450 ml
අතිරේක ප්‍රශ්වාස පරිමාව = 1450 ml ශේෂ පරිමාව = 1100 ml

මෙම පුද්ගලයාගේ ආශ්වාස ධාරිතාව, කෘත්‍යානුගත ශේෂ ධාරිතාව සහ ජීව ධාරිතාව නිවැරදි අනුපිළිවෙළින්

(1) 2950 ml, 2550 ml සහ 4400 ml වේ.
(2) 1900 ml, 1550 ml සහ 5050 ml වේ.
(3) 2950 ml, 1900 ml සහ 4400 ml වේ.
(4) 2550 ml, 3950 ml සහ 5050 ml වේ.
(5) 2950 ml, 2550 ml සහ 5500 ml වේ.

**24.** සතුන්ගේ ආහාර මාර්ගයට විවෘත වන්නේ පහත දැක්වෙන බහිස්‍රාවී ව්‍යුහ අතුරෙන් කුමක් ද?

(1) හරිත ග්‍රන්ථි (2) ලවණ ග්‍රන්ථි (3) සිඛ සෛල
(4) මැල්පිගීය නාලිකා (5) වෘක්කිකා

**25.** මිනිස් මොළයේ කොටස හා එහි කෘත්‍යය නිවැරදි ව දක්වන ප්‍රතිචාරය තෝරන්න.

(1) තැලමස – කෑම රුචිය යාමනය කිරීම
(2) හයිපොතැලමස – දේහ ඉරියව්ව පවත්වා ගැනීම
(3) මධ්‍ය මොළය – දෘෂ්ටි ප්‍රතීක සමායෝජනය කිරීම
(4) වැරෝලි සේතුව – නින්ද සහ අවදි වීමේ චක්‍ර යාමනය කිරීම
(5) අනුමස්තිෂ්කය – පහර දීමේ හෝ පලා යාමේ ප්‍රතිචාරය ආරම්භ කිරීම

**26.** මිනිස් ඇසේ දෘෂ්ටි විතානයේ සෛල ස්තර රුධිරග්‍රාහියේ සිට කාච රසය දෙසට සකස් වී ඇත්තේ පිළිවෙළින්

(1) අපිච්ඡද ස්තරය, ද්විධ්‍රැව සෛල, ගැංග්ලියා සෛල සහ ප්‍රකාශ ප්‍රතිග්‍රාහක ලෙස ය.
(2) ප්‍රකාශ ප්‍රතිග්‍රාහක, අපිච්ඡද ස්තරය, ගැංග්ලියා සෛල සහ ද්විධ්‍රැව සෛල ලෙස ය.
(3) අපිච්ඡද ස්තරය, ද්විධ්‍රැව සෛල, ප්‍රකාශ ප්‍රතිග්‍රාහක සහ ගැංග්ලියා සෛල ලෙස ය.
(4) ගැංග්ලියා සෛල, ද්විධ්‍රැව සෛල, ප්‍රකාශ ප්‍රතිග්‍රාහක සහ අපිච්ඡද ස්තරය ලෙස ය.
(5) අපිච්ඡද ස්තරය, ප්‍රකාශ ප්‍රතිග්‍රාහක, ද්විධ්‍රැව සෛල සහ ගැංග්ලියා සෛල ලෙස ය.

**27.** මිනිසාගේ ස්වයංසාධක ස්නායු පද්ධතියේ අනුවේගී කොටස උත්තේජනය වීම නිසා

(1) හෘත් ස්පන්දන වේගය අඩු වේ. (2) ජීරණය දිරි ගැන්වේ.
(3) ඇසේ කණිනිකාව සංකෝචනය වේ. (4) මුත්‍රා පහ කිරීම උත්තේජනය වේ.
(5) ශුක්‍ර මුදා හැරීම උත්තේජනය වේ.

**28.** පෝෂි මෙන් ම පෝෂි නොවන බලපෑමක් ඇති හෝමෝනය වන්නේ

(1) TSH ය. (2) ACTH ය. (3) ප්‍රොලැක්ටින් ය. (4) GH ය. (5) FSH ය.

**29.** සතුන්ගේ අලිංගික ප්‍රජනනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) එය සම්පූර්ණයෙන් ම ඌනන විභාජනය මත රඳා පවතී.
(2) විවිධ ප්‍රවේණිදර්ශ සහිත ජනිතයන් එමගින් ඇති විය හැකි ය.
(3) වෙනස් වන පරිසර තුළ විශේෂ පරිණාමය වීම එමගින් තහවුරු කෙරේ.
(4) තනි ජනකයෙකුගෙන් ජීවීන් ශීඝ්‍ර ලෙස ගුණනය වීම සඳහා එය දායක වේ.
(5) සංසේචනය වීමකින් තොර ව ශුක්‍රාණුවකින් නව ජීවීන් විකසනය විය හැකි ය.



Visit EDUHUB විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**30.** මානව හිස්කබලේ

(1) කපාලය තැනීම සඳහා හලාස්ථිය දායක වේ.
(2) ශිලාස්ථිය සහ තිලාස්ථිය වක්‍ර අස්ථි වේ.
(3) යුග චක්‍රය තැනීමට පාර්ශ්ව කපාල සහ යුග අස්ථි දායක වේ.
(4) අධෝහනුවේ මුදුනකාර ප්‍රසරය ශංඛක අස්ථිය සමග සන්ධානය වේ.
(5) ඌර්ධ්ව හනුක අස්ථිය සහ ලලාටාස්ථිය කෝටරක දරයි.

**31.** දෙමුහුම් දිරිය

(1) ප්‍රවේණිත ව සමාන ජීවීන් අතර අභිජනනයෙන් වැඩි කර ගත හැකි ය.
(2) $F_1$ පරම්පරාවට වඩා දෙමව්පියන්ගේ වැඩි ය.
(3) ඇති වන්නේ විෂමයුග්මකතාව වැඩි වීම මගිනි.
(4) දෙමුහුම් අතර අභිජනනයෙන් පවත්වා ගත හැකි ය.
(5) අන්තර් විශේෂ දෙමුහුම්කරණයේ ප්‍රතිඵලයකි.

**32.** ටොපොඅයිසොමරේස්වල කෘත්‍යයක් වන්නේ

(1) DNA දාමයේ හිදැස් මුද්‍රා තැබීමයි.
(2) DNA ද්විත්ව දාමයේ දඟර ලිහීමයි.
(3) වෙන් වූ DNA දාම ස්ථාවර කිරීමයි.
(4) අධික ව ඇඹරුණු DNA දාමවල ආතතිය සමනය කිරීමයි.
(5) DNA දාම අතර ඇති හයිඩ්‍රජන් බන්ධන කැඩීමයි.

**33.** සුන්‍යෂ්ටිකයන්ගේ පරිවර්තනය ප්‍රාග්න්‍යෂ්ටිකයන්ගේ පරිවර්තනයෙන් වෙනස් වන්නේ එය

(1) ප්‍රතිලේඛනය අවසන් වීමට ප්‍රථම ආරම්භ නොවන බැවිනි.
(2) න්‍යෂ්ටියේ සිදු වන බැවිනි.
(3) UAG, UAA හෝ UGA නැවතීමේ සංඥා ලෙස භාවිත කරන බැවිනි.
(4) පොලිසෝම නොසාදන බැවිනි.
(5) AUG කෝඩෝනයෙන් ආරම්භ නොවන බැවිනි.

**34.** සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය/වර්ෂණය වැඩි වන ආකාරයට බියෝම දක්වා ඇත්තේ පහත සඳහන් කුමන ප්‍රතිචාරයේ ද?

(1) ආක්ටික් තුන්ද්‍රා, සෞම්‍ය කලාපික තෘණ භූමි, සෞම්‍ය කලාපික පළල් පත්‍ර වනාන්තර
(2) සෞම්‍ය කලාපික තෘණ භූමි, සැවානා, නිවර්තන වර්ෂා වනාන්තර
(3) කාන්තාර, ඇල්පයින් තුන්ද්‍රා, උතුරු කේතුධර වනාන්තර
(4) ආක්ටික් තුන්ද්‍රා, චැපරාල්, සැවානා
(5) නිවර්තන වියළි වනාන්තර, චැපරාල්, ඇල්පයින් තුන්ද්‍රා

**35.** තර්ජනයට ලක් වූ ජීවීන් තිදෙනෙකු සහිත ප්‍රතිචාරය තෝරන්න.

(1) බෙංගාලි කොටියා, ඩෝඩෝ, ශ්‍රී ලංකාවේ අලියා
(2) බුලත්හපයා, යෝධ ඉබ්බා, ලෝම මැමත්
(3) තිලාපියා, ජපන් ජබර, කැහිබෙල්ලා
(4) කළුතර ගොළුබෙල්ලා, යෝධ පැන්ඩා, සුදු රෙදි හොරා
(5) මහ මඩු, වෙසක් ඕකිඩ්, පුංචි ලේනා

**36.** ගෝලීය උණුසුම අඩු කිරීම සඳහා දායක විය හැක්කේ පහත සඳහන් කුමන අන්තර්ජාතික සම්මුතිය ද?/සම්මුති ද

A - කියෝතෝ සම්මුතිය
B - බාසල් සම්මුතිය
C - මොන්ට්‍රියල් ප්‍රඥප්තිය
D - කාටජිනා ගිවිසුම

(1) A පමණි. (2) A සහ B පමණි. (3) A සහ C පමණි.
(4) A, B සහ C පමණි. (5) A, B සහ D පමණි.

**37.** ක්ෂුද්‍රජීවීන් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) මයිකොප්ලාස්මාවන් සියල්ලෝම පාහේ සතුන්ගේ සහ ශාකවල පරපෝෂිතයෝ වෙති.
(2) දිලීර යනු මෘතෝපජීවී හෝ පරපෝෂී හෝ පෝෂණ ක්‍රම දක්වන රසායනික විෂමපෝෂීන් ය.
(3) දම් සල්ෆර් නොවන බැක්ටීරියා ශක්ති ප්‍රභවය ලෙස ආලෝකය සහ කාබන් ප්‍රභවය ලෙස $CO_2$ භාවිත කර
(4) ස්ට්‍රෙප්ටොකොකස බැක්ටීරියා බහුතලීය ලෙස විභාජනය වේ.
(5) සයනොබැක්ටීරියාවල නයිට්‍රජන් තිර කිරීම උත්ප්‍රේරණය වන්නේ ඒකයිනිට තුළ අඩංගු නයිට්‍රජනේස් එන්සයි මගිනි.



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**38.** ඇතැම් බැක්ටීරීය ව්‍යාධිජනකයන්
(1) ආක්‍රමණශීලීතාවට දායක වන පොස්ෆොලයිපේස් නිපදවයි.
(2) තාප අස්ථායී ලිපොපොලිසැකරයිඩ වන අන්තඃවිෂ නිපදවයි.
(3) ධාරක පටකයට ඇතුළු වීම සඳහා කෝෂ්ඨය සහ පිලයි භාවිත කරයි.
(4) ධාරකයාගේ පරිවෘත්තියට වෙනසක් සිදු නොකර ධාරක සෛලවලින් පෝෂණ ද්‍රව්‍ය ලබා ගනී.
(5) සෛල සම්බන්ධ කරන බදාම ද්‍රව්‍යය බිඳ හෙළන ලෙසිතිනේස් නිපදවයි.

**39.** ක්ෂුද්‍රජීවීන්ගේ කාර්යභාරයන් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) බැක්ටීරියා සහ දිලීර මගින් කාබනික ද්‍රව්‍ය ඛනිජභවනය කිරීමේදී ඔක්සිජන්, ජලය සහ $CO_2$ නිදහස් කෙරේ.
(2) මෙතනොට්‍රොෆ් ක්ෂුද්‍රජීවීහු සාගර අවසාදිතවලින් මීතේන් නිපදවති.
(3) පසේ ඔක්සිජන් සීමාකාරී වන විට *Pseudomonas* sp. නයිට්‍රීහරණය සිදු කරයි.
(4) රයිසෝබියා යනු පසේ සිටින, නයිට්‍රජන් තිර කරන නිදැලිවාසී බැක්ටීරියා ය.
(5) මූලගෝල දිලීර සියල්ල ශාකවලට හිතකර ය.

**40.** රෝගය සහ ඊට හේතුකාරක වන ක්ෂුද්‍රජීවියා නිවැරදිව දක්වන ප්‍රතිචාරය තෝරන්න.
(1) බොටියුලිනියාව – *Staphylococcus* sp.
(2) පිටගැස්ම – *Clostridium* sp.
(3) කොළරාව – *Shigella* sp.
(4) අතීසාරය – *Salmonella* sp.
(5) උණසන්නිපාතය – *Vibrio* sp.

● **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදි ය. කවර ප්‍රතිචාරය/ප්‍රතිචාර නිවැරදි ද යන්න පළමුවෙන් ම විනිශ්චය කර ගන්න. ඉන් පසු නිවැරදි අංකය තෝරන්න.**

(A), (B), (D) යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් .................................... (1)
(A), (C), (D) යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් .................................... (2)
(A) සහ (B) යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් .................................... (3)
(C) සහ (D) යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් .................................... (4)
වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදි නම් ............... (5)

| උපදෙස් සැකෙවින් | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (A), (B), (D) නිවැරදි ය. | (A), (C), (D) නිවැරදි ය. | (A), (B) නිවැරදි ය. | (C), (D) නිවැරදි ය. | වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**41.** මිනිසාගේ ශ්වසන පද්ධතියේ ඇති පටකවල දැකිය හැකි ලක්ෂණ තෝරන්න.
(A) තැටි ආකාර සෛල තනි ස්තරයක්
(B) විවිධ උස සහිත සෛල තනි ස්තරයක්
(C) දාදු කැට හැඩැති සෛල තනි ස්තරයක්
(D) කොන්ඩ්‍රොයිටින් සල්ෆේට් සහිත පුරකයක්
(E) ගඩොල් කැට හැඩැති සෛල තනි ස්තරයක්

**42.** අධිග්‍රහණය කරන ලද ආහාරවලට මිනිසාගේ මුඛ කුහරයේදී, ආමාශයේදී සහ කුඩා අන්ත්‍රයේදී හමුවන ද්‍රව්‍ය තුනක් වන්නේ පිළිවෙලින්
(A) ලයිසොසයිම්, පෙප්සින් සහ ඇමයිනොපෙප්ටිඩේස් ය.
(B) ඉමියුනොග්ලොබියුලින්, HCl සහ කයිමොට්‍රිප්සින් ය.
(C) බේට ඇමයිලේස්, ඩයිපෙප්ටිඩේස් සහ ලයිපේස් ය.
(D) ශ්ලේෂ්මලය, පෙප්සින් සහ පිත ය.
(E) ලයිසොසයිම, කාබොක්සිපෙප්ටිඩේස් සහ ඇමයිලේස් ය.

**43.** සංසරණ පද්ධතිවල ලක්ෂණ කිහිපයක් සහ එම එක් එක් ලක්ෂණය පෙන්වන සතුන්ට නිදසුනක් බැගින් පහත දී ඇත. නිවැරදි "ලක්ෂණය – නිදසුන" සංකලනය/සංකලන තෝරන්න.
(A) සංසරණ තරලය සහ අන්තරාල තරලය අතර වෙන්වීමක් නොමැති වීම – පත්තෑයා
(B) පුප්ඵුසීය ශිරා තිබීම – මකුළුවා
(C) හෘදයේ ඇති පුට හරහා සංසරණ තරලය හෘදයට ආපසු ගැලීම – කැරපොත්තා
(D) කුටීර දෙකකින් යුත් හෘදය – මඩුවා
(E) රුධිර කේශනාලිකා නොතිබීම – කාපයා



Visit EDUHUB ... විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**44.** ප්‍රතිදේහ
(A) ප්ලාස්ම සෛල මගින් ස්‍රාවය කරනු ලබන ප්‍රෝටීන වේ.
(B) B වසා සෛල ප්‍රතිදේහජනක ප්‍රතිග්‍රාහකවල ද්‍රාව්‍ය ස්වරූප වේ.
(C) ප්‍රතිශක්ති ප්‍රතිචාර ආරම්භ කරන එපිටෝප දරයි.
(D) දේහ තරලවල සිටින ව්‍යාධිජනකයන් අක්‍රිය කරයි.
(E) ව්‍යාධිජනකයන් විසින් ආසාදනය කරනු ලැබූ දේහ සෛල මරණයට පත් කරයි.


**45.** මිනිසාගේ වෘෂණයේ ඇති පහත සඳහන් සෛල අතුරෙන් ද්විගුණ වන්නේ මොනවා ද?
(A) ප්‍රාථමික ශුක්‍රාණු සෛල
(B) ද්විතීයික ශුක්‍රාණු සෛල
(C) ශුක්‍රාණු මාතෘ සෛල
(D) ලේඩිග් සෛල
(E) ප්‍රාක්ශුක්‍ර

**46.** මිනිස් කශේරුවේ
(A) අස්ථි 24 ක් රේඛීය ව සකස් වී ඇත.
(B) ග්‍රෛව වක්‍රය, ඉපදීමෙන් මාස 7–8 දී පමණ විකසනය වේ.
(C) උරස් ප්‍රදේශය තැනී ඇත්තේ කශේරුකා 12 කිනි.
(D) ග්‍රෛව කශේරුකාවල කශේරුක ධමනි සඳහා සිදුරු ඇත.
(E) කටි කශේරුකාවල ද්විභින්න කණ්ටක ප්‍රසර ඇත.

**47.** මෙන්ඩල්ගේ පරීක්ෂණවල ප්‍රතිඵල පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) ඒකාංග මුහුමක $F_2$ පරම්පරාවේ රූපාණුදර්ශ අතර අනුපාතය 3:1 වේ.
(B) ද්විඅංග මුහුමක ආවේණික සාධක එකම වර්ණදේහය මත එකිනෙකට ආසන්න ව පිහිටයි.
(C) එක් එක් ආවේණික ලක්ෂණය නිර්ණය කරනු ලබන්නේ ආවේණික සාධක දෙකක් මගිනි.
(D) ද්විඅංග මුහුමක ආවේණික සාධක පිහිටනුයේ සමජාත නොවන වර්ණදේහ දෙකක් මත ය.
(E) ද්විඅංග මුහුමක $F_2$ පරම්පරාවේ ප්‍රවේණි දර්ශ අතර අනුපාතය 9:3:3:1 වේ.

**48.** DNA අනුක්‍රමයක එක් නියුක්ලියොටයිඩයක් ආදේශ වීම නිසා
(A) නිහඬ විකෘතියක් ඇති විය හැකි ය.
(B) කියවීම් රාමුව විස්ථාපනය විය හැකි ය.
(C) වඩාත් කෙටි පෙප්ටයිඩයක් ඇති විය හැකි ය.
(D) පිළිකා ඇති විය හැකි ය.
(E) ජානය කෙටි විය හැකි ය.

**49.** මෙම ප්‍රශ්නය පහත දී ඇති ආහාර ජාලය මත පදනම් වේ.




ඉහත ආහාර ජාලයේ එකම පෝෂී මට්ටමේ සිටින ජීවීන් ලෙස සැලකිය හැක්කේ
(A) රාජාලියා සහ සර්පයා ය.
(B) දිවියා සහ නරියා ය.
(C) ගෙම්බා සහ මීයා ය.
(D) ගෙම්බා සහ රාජාලියා ය.
(E) තණකොළපෙත්තා සහ දිවියා ය.

**50.** පානීය ජලය පිරියම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) අවසාදිත ද්‍රව්‍ය සහ ක්ෂුද්‍රජීවීන් ඉවත් කිරීම සඳහා ඇලම් එකතු කරනු ලැබේ.
(B) ක්ෂුද්‍රජීවීන් නැසීම සඳහා ඕසෝන් භාවිත කෙරේ.
(C) පෙරීම් ක්‍රියාවලියේදී වැලි අංශු තුළට අවශෝෂණය කිරීම මගින් ක්ෂුද්‍රජීවීන් ඉවත් කෙරේ.
(D) ක්ෂුද්‍රජීවීන් පෙරීම සඳහා කාන්දු පෙරහන් ක්‍රමය භාවිත කෙරේ.
(E) ප්‍රාථමික පිරියම් කිරීමේදී පෙන්ද්‍රිය ද්‍රව්‍ය 90%ක් පමණ ඉවත් කෙරේ.

* * *



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

WWW.ALEVELAPI.COM



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

| විෂයය අංකය<br>பாட இலக்கம் | 09 | විෂයය<br>பாடம் | ජීව විද්‍යාව | Biology (New) |
|---|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 5 | 31. | 3 | 41. | 1/~~5~~ |
| 02. | 5 | 12. | 5 | 22. | 5 | 32. | 4 | 42. | 1 |
| 03. | 2 | 13. | 3 | 23. | 1 | 33. | 1 | 43. | 2 |
| 04. | 5 | 14. | 4 | 24. | 4 | 34. | 1 | 44. | 1 |
| 05. | 5 | 15. | 3 | 25. | 3 | 35. | 5 | 45. | 2 |
| 06. | 3 | 16. | 4 | 26. | 5 | 36. | 3 | 46. | 4 |
| 07. | 1 | 17. | 5 | 27. | 5 | 37. | 2 | 47. | 2 |
| 08. | 2 | 18. | 4 | 28. | 4 | 38. | 1 | 48. | 2 |
| 09. | 4 | 19. | 2 | 29. | 4 | 39. | 3 | 49. | 1 |
| 10. | 2 | 20. | 1 | 30. | 5 | 40 | 2 | 50 | ~~3~~ 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50



Visit EDUHUB සියලුම විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස්පෙළ) විභාගය - 2020
## 09 - ජීව විද්‍යාව- II
## ලකුණු දීමේ පටිපාටිය

A කොටස – ව්‍යුහගත රචනා

---

1. (A) (i) ජීවීන් සතු ලාක්ෂණික ලක්ෂණයක් වන්නේ උද්දීප්‍යතාවයයි. උද්දීප්‍යතාව යන්නෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

බාහිර හා අභ්‍යන්තර පරිසරවලින් පැමිණෙන උත්තේජවලට ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව/ බාහිර හා අභ්‍යන්තර උත්තේජවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව

**01 pt**

(ii) පහත සඳහන් එක එකෙහි තැනුම් ඒකකය කුමක් ද?

පෙක්ටින් : ගැලැක්ටොයුරොනික් අම්ලය

හෙමිසෙලියුලෝස් : පෙන්ටෝස

**02 pt**

(iii) NAD$^+$, NADP$^+$ සහ FADවල පොදු කෘත්‍යයන් **දෙකක්** සඳහන් කරන්න.

- සහ - එන්සයිමයක් ලෙස ක්‍රියාකරයි.
- ඉලෙක්ට්‍රෝන වාහකයක් ලෙස ක්‍රියා කරයි

**02 pts**

(iv) සෛලප්ලාස්මීය සංසරණය සහ වර්ණදේහවල චලනය සඳහා උපකාරී වන ව්‍යුහය නම් කර එහි ව්‍යුහාත්මක සංඝටක සඳහන් කරන්න.

ව්‍යුහය : සෛලීය සැකිල්ල /සෛල සැකිල්ල **01 pt**

ව්‍යුහාත්මක සංඝටක : ක්ෂුද්‍ර සූත්‍රිකා/ ඇක්ටීන් සූත්‍රිකා
ක්ෂුද්‍ර නාලිකා
අන්තර්මාධ්‍ය සූත්‍රිකා / අතරමැදි (Any **02 pts**)

-ව්‍යූහය නිවැරදි වීම අනිවාර්යයි.

(v) ශාක සෛලයක ද්විතීයික සෛල බිත්තිය පිහිටන ස්ථානය සඳහන් කර සෙලියුලෝස්වලට අමතරව එහි ඇති ද්‍රව්‍යයක් නම් කරන්න.

පිහිටන ස්ථානය : ප්ලාස්ම පටලය හා ප්‍රාථමික සෛල බිත්තිය අතර **01 pt**
ප්ලාස්ම පටලයට පිටතින්, ප්‍රාථමික සෛල බිත්තියට ඇතුළතින්.
ද්‍රව්‍යය : ලිග්නීන් / සුබෙරින්

**01 pt**

(B) (i) ඌනන විභාජනයේදී ප්‍රවේණික ප්‍රභේදන ඇති වීමට දායක වන සිදුවීම් **තුන** මොනවා ද?

- අවතරණය
- ප්‍රතිසංයෝජනය
- ස්වාධීන සංරචනය

**03 pts**

(ii) ශාක සෛලවලට අහිතකර ප්‍රතික්‍රියාකාරී ඔක්සිකාරක අණු නිපදවීම වළක්වන ප්‍රභාසංශ්ලේෂී වර්ණක වර්ගය නම් කරන්න.

කැරටිනොයිඩ **01 pt**



Visit EDUHUB විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(iii) ප්‍රභාසංශ්ලේෂණයේ ක්‍රියා වර්ණාවලිය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

ආලෝකයේ විවිධ තරංග ආයාම මගින් ප්‍රභාසංශ්ලේෂණයේ (උත්තේජනය කිරීමේ) ඵලදායිත්වය පෙන්වන ප්‍රස්ථාරය/ ආලෝකයේ විවිධ තරංග ආයාමවලදී ප්‍රභාසංශ්ලේෂණ සීඝ්‍රතාවය වෙනස් වීම පෙන්වන ප්‍රස්ථාරයයි.

5/0 marks

(iv) C4 ශාකවල $CO_2$ තිර කිරීම සිදු වන සෛල වර්ග **දෙක** නම් කර ඒ එක එකෙහි ඇති $CO_2$ ප්‍රතිග්‍රාහකය සහ $CO_2$ තිර කරන එන්සයිමය නම් කරන්න.

| සෛල වර්ගය | $CO_2$ ප්‍රතිග්‍රාහකය | $CO_2$ තිර කරන එන්සයිමය |
|---|---|---|
| (a) පත්‍රමධ්‍ය සෛල | PEP/පොස්ෆොඊනෝල් පයිරුවේට් | PEP කාබොක්සිලේස් |
| (b) කලාප කොපු සෛල | RuBP/රිබියුලෝස් බිස්පොස්ෆේට් | රුබිස්කෝ/RuBP කාබොක්සිලේස් ඔක්සිජනේස් |

* සෛල වර්ගය හරිද් නම් ප්‍රතිග්‍රාහක, එන්සයිම → ලකුණු නැත. 06 pts

(v) ඉහත B(iv) හි සඳහන් කරන ලද සෛල වර්ග දෙක එකිනෙක සමග තදින් සම්බන්ධ වන්නේ කෙසේ ද?

ප්ලාස්ම බන්ධ විශාල සංඛ්‍යාවක් පවත්වා ගැනීමෙන් / විශාල ගණනක් තිබීම 01 pt

(C) (i) පෘථිවිය මත ප්‍රථම සුන්‍යෂ්ටිකයන් ඇති වූයේ කුමන භූ විද්‍යාත්මක කල්පයේදී ද?

ප්‍රොටෙරොසොයික 01 pt

(ii) **ජීවීන්ගේ පරිණාමයේදී ඇති වූ සිද්ධීන් තුනක් පහත දැක්වේ.**

P - ක්ෂීරපායින් සම්භවය වීම

Q - බීජ ශාක සම්භවය වීම

R - ආවෘත බීජක ශාක ප්‍රමුඛ වීම

ඉහත සඳහන් සිද්ධීන් අදාළ අක්ෂර භාවිතයෙන් කාලක්‍රමානුගත ලෙස ලියන්න.

Q P R 01 pt

(iii) ප්ලැටිහෙල්මින්තේස් වංශයේ නිදැලිවාසී ආකාරවල දැකිය හැකි, එනමුත් පරපෝෂී ආකාරවල දැකිය නොහැකි ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

- අක්ෂිලප/ සංවේදී ඉන්ද්‍රියයන්
- පක්ෂ්ම
- කීට ආකාර නැත/ කීට අවධි රහිතව විකසනය වීම / කීට අවස්ථා ආකාරයන් නැත./
- බිහිතලනය කළ හැකි ග්‍රසනිකාව / උත්වර්තනය කළ හැකි ග්‍රසනිකාව.

ඕනෑම 03pts



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(iv) බීජ ශාකවල පුං සහ ජායා ජන්මාණුශාක පිහිටන්නේ කොතැන්හි දැයි සඳහන් කරන්න.

පුං ජන්මාණුශාකය : පරාග කණිකාව තුළ

ජායා ජන්මාණුශාකය : ඩිම්බය තුළ

**02 pts**

(v) පහත සඳහන් ප්‍රොටිස්ටාවන් වෙන් කර හඳුනාගැනීම සඳහා දී ඇති දෙබෙදුම් සූචිය සම්පූර්ණ කරන්න

*Euglena*, *Paramecium*, *Amoeba*, *Ulva*, *Sargassum*, ඩයටම

| | | |
|---|---|---|
| (1) | සෛල බිත්තිය ඇත. | 2 |
| | සෛල බිත්තිය නැත. | 4 |
| (2) | බහු සෛලික ය. | 3 |
| | ඒක සෛලික ය. | ඩයටම |
| (3) | වායු පිරි උත්ප්ලාවක ඇත. | *Sargassum* |
| | වායු පිරි උත්ප්ලාවක නැත. | *Ulva* |
| (4) | ජවිකාව ඇත. | 5 |
| | ජවිකාව නැත. | *Amoeba* |
| (5) | පක්ෂ්ම ඇත. | *Paramecium* |
| | පක්ෂ්ම නැත. | *Euglena* |

- spelling! වැර → නොවලයි. (විද්‍යාත්මක නීති නොසලකයි).
- හරියට තැන වෙන කොන් වලයි.

**10 pts**

**38 pts x 2.5 = 95** ලකුණු
**B (iii) සඳහා = 05** ලකුණු
**Total = 100** ලකුණු

**2. (A)** (i) ශාකවල වර්ධනයට දායක වන ක්‍රියාවලි **තුන** සඳහන් කරන්න.

- සෛල විභාජනය
- සෛල දිගින් වැඩි වීම / දික්වීම .
- සෛල විභේදනය / සෛල පරිණත වීම.

- මීට වඩා වැඩි නම් ලකුණු ↓.

**03 pts**

(ii) පහත සඳහන් එක් එක් ශාක පටකයේ **කෘත්‍යයක්** බැගින් සඳහන් කරන්න.

සනාල කැම්බියම : ද්විතීයික සනාල පටක නිපදවීම/ද්විතීයික ශෛලම හා ප්ලෝයම නිපදවීම

වල්ක කැම්බියම : පරිවර්මය සෑදීම/ වල්කය සෑදීම (ඇතිකිරීම)

**02 pts**

(iii) ශාකවල පහත සඳහන් එක් එක් ක්‍රියාව සිදු වන්නේ කුමන ව්‍යුහය හරහා ද?

- කාෂ්ඨීය කඳක වායු හුවමාරුව : වා සිදුරු
- බිංදුදය : ජල සිදුරු

**02 pts**

වැස්සුරු වැරදි සිදුරු → ලකුණු ↓.



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(iv) $K^+$ අයන එක්රැස් වන අවස්ථාවේ සිට පුටිකා විවෘත වීම දක්වා පාලක සෛලවල සිදු වන්නේ කුමක් දැයි නිවැරදි අනුපිළිවෙළින් සඳහන් කරන්න.

- ජල විභවය අඩුවීම/ ද්‍රාව්‍ය විභවය වැඩිවීම
- (ආසූතියෙන්) ජලය ගලා ඒම
- ශූනතාවය වැඩිවීම
- සෛල ප්‍රසාරණය වීම
- ඇතුළු බිත්තිය නැමීයාම/ ඇතුළු බිත්ති එකිනෙකින් ඈත්වීම


**05 pts**

(v) අවධි මට්ටමකට වඩා අඩු උෂ්ණත්වයන් ශාක සෛලවල සෛල පටලයට බලපාන්නේ කෙසේ ද?

- ලිපිඩ ස්ඵටිකමය ස්වාභාවයට පත්වීම
- පටලයේ තරලමය ස්වභාවය නැති වී යාම
- (පටලය හරහා) ද්‍රව්‍ය පරිවහනය අවහිර වීම
- පටල එන්සයිම ප්‍රතික්‍රියාවල ශීඝ්‍රතාවය අඩුවීම/ එන්සයිම ක්‍රියාව නතර වීම

ඕනෑම **03 pts**

(B) (i) භෞමික ශාකයක ජීවන චක්‍රයේ දළ සටහනක් පහත දී ඇත.
**A, B** සහ **C** ලෙස දක්වා ඇති ක්‍රියාවලි හා **D** සහ **E** ලෙස දක්වා ඇති ව්‍යුහ නම් කරන්න.




A : අනූනනය
B : සංසේචනය
C : ඌනනය
D : (ද්විගුණ) යුක්තාණුව
E : (ඒක ගුණ) බීජාණුව

**05 pts**

(ii) පහත දැක්වෙන සහජීවී ආකාර සඳහන් කරන්න.

- ජීවීන් දෙදෙනාටම වාසිදායක වේ : අන්‍යෝන්‍යාධාරය
- එක් ජීවියෙකුට වාසිදායක අතර අනෙකාට බලපෑමක් නැත : සහභෝජිත්වය

**02 pts**

(iii) (a) උස 153 cm සහ බර 50 kg වන පුද්ගලයෙකුගේ දේහ ස්කන්ධ දර්ශකය ගණනය කරන්න.

- $\frac{\text{ස්කන්ධය (kg)}}{\text{උස}^2 (m^2)}$ හෝ $\frac{50}{(1.53)^2}$
- $= \underline{21.36} \approx 21.4$

සමීකරණය හෝ ආදේශ කිරීම **01 pt**
පිළිතුර **01 pt**

(b) ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායකවලට අනුව, දුෂ්පෝෂී නොවන අයෙකු ලෙස සැලකීම සඳහා මෙම පුද්ගලයාට තිබිය යුතු අවම බර කොපමණ ද?
(ඔබගේ පිළිතුර kgවලින් පළමුවැනි දශමස්ථානයට දෙන්න.)

**43.3** (kg) **01 pt**



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(iv) ප්‍රතිඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරන, මේදවල ද්‍රාව්‍ය විටමිනයක් නම් කරන්න.

* විටමින් E

**01 pt**

(v) මිනිසාගේ ආහාර මාර්ගය මඟින් ස්‍රාවය කරනු ලබන, එකිනෙකට ප්‍රතිවිරුද්ධ කෘත්‍යයන් දක්වන හෝර්මෝන **දෙකක්** නම් කරන්න.

* කොලිසිස්ටොකයිනින් /සික්‍රටීන්
* ගැස්ට්‍රින්

**02 pts**

(C) (i) (a) අපිච්ඡද පටකවලට සහ සම්බන්ධක පටකවලට පොදු කෘත්‍යයක් සඳහන් කරන්න.

* ආරක්ෂාව

**01 pt**

(b) ආලෝක අන්වීක්ෂයක් තුළින් නිරීක්ෂණය කිරීමේදී ඝන සම්බන්ධක පටකයක දක්නට ලැබෙන, වෙනත් සම්බන්ධක පටකවලින් එය වෙන් කර හඳුනාගැනීමට භාවිත කළ හැකි ව්‍යුහාත්මක ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

* (කොලැජන්) තන්තු තදින් ඇසිරී ඇත.
* පූරකය ක්ෂීණ වී ඇත. / අඩු වී ඇත.
* සෛල සුළු සංඛ්‍යාවකි.

**03 pts**

(ii) මිනිස් හෘදයේ SA ගැටයේ සහ AV ගැටයේ කෘත්‍ය සඳහන් කරන්න.


SA ගැටය : • හෘත් ස්පන්දනය ආරම්භ කිරීම/ හෘදයේ සංකෝචනය සඳහා උත්තේජ ජනනය කිරීම
• හෘත් ස්පන්දනවල රිද්මයානුකූල සැකසීම

**02 pts**

AV ගැටය : • කර්ණිකාවල සිට කෝෂිකා වෙත විද්‍යුත් සංඥා/ ආවේග සම්ප්‍රේෂණය කිරීම

**01 pt**

(iii) නිරෝගී පුද්ගලයකුගේ සාමාන්‍ය ECG සටහන ඇඳ එහි තරංග නම් කරන්න.




| | |
|---|---|
| රූප සටහන | 01pt |
| නිවැරදි නම් කිරීම | 01pt |

(label 5)

(iv) ECG සටහනේ ප්‍රථම සහ අවසාන තරංගවලින් නිරූපණය කෙරෙන්නේ මොනවා දැයි ස කරන්න.

* ප්‍රථම තරංගය : කර්ණිකා විධ්‍රැවනය / (SA ගැටයේ සිට) ආවේග කර්ණිකා මතින් පැතිර යාම.

**01 pt**

* අවසන් තරංගය : කෝෂිකා ප්‍රතිධ්‍රැවනය (කෝෂිකා ඉහිල් වීම)

**01 pt**



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(v) හිමොග්ලොබින් අණුවක් 'Hb' ලෙස සලකමින්, පෙනහැල්ලේ රුධිර කේශනාලිකාවල ඇති රතු රුධිරාණු තුළ පමණක් සිදු වන රසායනික ප්‍රතික්‍රියාව සඳහා වූ සමීකරණය ලියන්න.

* $Hb + 4O_2 \leftrightharpoons HbO_8$

**01 pt**

**40pts x 2.5 = 100 ලකුණු**

3\. (A) (i) ඉන්ටෆෙරොන් යනු මොනවා දැයි කෙටියෙන් සඳහන් කරන්න.

- වෛරස මගින් ආසාදනය වූ (දේහ) සෛල වලින් ස්‍රාවය කරන ප්‍රෝටීන වන මේවා
- ආසාදනයට ලක් නොවූ (දේහ) සෛල (වෛරස ආසාදනයෙන්) ආරක්ෂා කරයි.
- ඒ ප්‍රතිවෛරස ප්‍රෝටීන නිපදවීම උත්තේජනය කිරීම/ වෛරසවල ප්‍රතිවලිතවීම නිශේධනය කරන ප්‍රෝටීන ස්‍රාවය/උත්තේජනය කිරීම මගිනි

**03 pts**

(ii) මිනිස් වෘක්කාණුව ආශ්‍රිතව ගුච්ඡිකාවට අමතරව ඇති කේශනාලිකා ජාල **දෙකක්** නම් කරන්න.

- පරිනාලාකාර කේෂනාලිකා
- වාසාරෙක්ටා

**02 pts**

(iii) වෘක්ක රෝගීන් සඳහා සිදු කරනු ලබන කාන්දු පෙරීම යනු කුමක් ද?

රුධිරයේ ඇති

- අපද්‍රව්‍ය,
- අතිරික්ත ද්‍රාව්‍ය හා
- විෂ

කෘත්‍රිමව (රුධිරයෙන්) ඉවත් කිරීමේ ක්‍රියාවලියයි.

**03pts**

(iv) ස්නායුක සමායෝජනය සහ හෝමෝනමය සමායෝජනය අතර ඇති සමානකමක් සඳහන් කරන්න.

රසායනික සම්ප්‍රේෂණය

**01pt**

(v) මොළය, උදරීය ස්නායුරජ්ජුව සහ ඛණ්ඩික ගැංග්ලියා සහිත සතුන් අන්තර්ගත වංශ **දෙකක්** නම් කරන්න.

- ඇනෙලිඩා
- ආත්‍රොපෝඩා

**02pts**

(B) (i) (a) මිනිස් මොළයේ කෝෂිකා ලෙස හැඳින්වෙන්නේ මොනවා ද?

මධ්‍ය නාලයේ ඇති අක්‍රමවත් හැඩැති කුහර

**01pt**

(b) මොළ දණ්ඩ තැනෙනුයේ මිනිස් මොළයේ කුමන කොටස් **තුන** මගින් ද?

- මධ්‍ය මොළය
- වැරෝලි සේතුව
- සුෂුම්නා ශීර්ෂකය

**03pts**



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ii) මානව සුෂුම්නාවේ කෘත්‍යයන් **දෙකක්** සඳහන් කරන්න.

- මධ්‍ය ස්නායු පද්ධතිය, සංවේදක හා චාලක නියුරෝන වලට සම්බන්ධ කිරීම
- මොළය දෙසට හා ඉන් ඉවතට ආවේග ප්‍රචාරණය (සඳහා පහසුකම් සැලසීම)
- ප්‍රතීක ඇති කිරීම / ප්‍රතීක සමායෝජනය කිරීම

ඕනෑම 02 pts

(iii) නියුරෝනයක අනස්සව කාලයේ වැදගත්කම කුමක් ද?

ස්නායු ආවේග/ආපසු සන්නයනය වීම/ ප්‍රත්‍යාවර්තනය වැලැක්වීම

01 pt

(iv) වයස්ගත පුද්ගලයන්ගේ පේශි චලනවල සමායෝජනය සහ පාලනය නැති වී යෑම සිදු කරන, ස්නායු පද්ධතියේ ප්‍රගාමී චාලක ආබාධය නම් කරන්න.

පාකින්සන් රෝගය

01pt

(v) හෝමෝනයක් යනු කුමක් දැයි කෙටියෙන් සඳහන් කරන්න.

- අන්තරාසර්ග ග්‍රන්ථි/ සෛලවලින් ස්‍රාවය කරන විශිෂ්ට ආකාරයේ සංඥා අණු වන මේවා
- රුධිරය මඟින් පරිවහනනය වී
- (සිරුරේ වෙනත් ස්ථානයක)ඇති විශිෂ්ට ඉලක්ක සෛල මත ක්‍රියා කරයි/ කෘත්‍ය වෙනස් කරයි.

03pts

(C) (i) (a) සර්ටෝලි සෛලවල කෘත්‍ය **තුනක්** සඳහන් කරන්න.

- ඉන්හිබීන් ස්‍රාවය කිරීම
- ශුක්‍රාණු ජනනයේ විවිධ අදියර වල පවතින සෛල වලට පෝෂණය සැපයීම සහ
- සවිවීම/ සන්ධාරණය සැපයීම

03pts

(b) මිනිස් ශුක්‍රාණුවේ අග්‍ර දේහයේ කෘත්‍යය සඳහන් කරන්න.

- එහි අන්තර්ගත ජල විච්ඡේදක එන්සයිම/ ට්‍රිප්සින් සහ හයලුරොනිඩේස් මගින්
- ඩිම්බයේ පිටත පටල සිදුරුකර
- ඩිම්බය තුළට ඇතුළු වීම සඳහා ශුක්‍රාණුවට ආධාර වීම

03pts

(c) ශුක්‍රාණු පරිණත වන්නේ පුරුෂ ප්‍රජනක පද්ධතියේ කුමන ව්‍යුහය තුළදී ද?

අපිවෘෂණය

01pt

(ii) (a) ගර්භණී අවස්ථාවේදී භ්‍රෑණයේ ප්‍රවේණික ආබාධ විශ්ලේෂණය කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

- කෝරියම් අංගුලිකා/ කලලාවාරික තරලය ලබාගැනීම
- භ්‍රෑණයේ ගෙනෝමය විශ්ලේෂණය කිරීම

Any 02pts



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(b) මානව භ්‍රෑණයේ ඇති ඔක්සිජන් හීන රුධිරය, ඔක්සිජන් ලබාගෙන නැවත භ්‍රෑණයට පැමිණෙන මාර්ගය නිවැරදි අනුපිළිවෙළින් ලියන්න.

(භ්‍රෑණය) ⟶ පෙකණි ධමනි (දෙක) ⟶ කෝරියම් අංගුලිකා ⟶ පෙකණි ශිරා ⟶ (භ්‍රෑණය)

**01pt**

(iii) කැල්සියම් කාබනේට් ඵලකවලින් සමන්විත අභ්‍යන්තර සැකිල්ලක් දරන සතුන් ඇතුළත් වංශයක් නම් කරන්න.

එකයිනොඩර්මේටා

**01pt**

(iv) (a) මිනිසාගේ ආශ්වාසයේදී ප්‍රථම පර්ශු යුගල චලනය **නොවන්නේ** මන් ද?

එය උරෝස්ථියට හා පළමු උරස් කශේරුකාවට (තදින්) සම්බන්ධ වී පැවතීම නිසා

**01pt**

(b) ඍජු ඉරියව්ව පවත්වා ගැනීමට උපකාරී වන මානව කශේරුවේ දක්නට ලැබෙන ව්‍යුහාත්මක ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

- ද්විතීයික වක්‍ර දෙකක් විකසනය වීම/ ප්‍රාථමික වක්‍ර දෙකක් හා ද්විතීයික වක්‍ර දෙකක් පැවැතීම
- කශේරුවේ අන්තය දෙසට පිහිටන කශේරුකා විශාල වීම
- (ත්‍රිකාස්ථික) කශේරුකා බද්ධ වීමෙන් ත්‍රිකාස්ථිය තැනීම

**03pts**

(v) (a) මිනිසාගේ පහළ ගාත්‍රයේ පත්ලේ ඇති වක්‍රවල කෘත්‍යය සඳහන් කරන්න.

සිටගෙන සිටින විට /ඇවිදින විට දේහයේ බර (සමානව) ව්‍යාප්ත කිරීම.

**01pt**

(b) මිනිස් දේහයේ ගෝල කුහර සන්ධි පිහිටන ස්ථාන **දෙකක්** සඳහන් කරන්න.

- ප්‍රගන්ඩාස්ථිය අංසඵලකයේ ග්ලෙනොයිඩ කුහරය සමඟ / උරහිස් සන්ධිය
- ඌර්වස්ථියේ හිස (ශ්‍රෝණි අස්ථියේ / ශ්‍රෝණියේ )ශ්‍රෝණි කෝටරකය සමඟ / උකුල් සන්ධිය

**02pts**

**40pts x 2.5 = 100 ලකුණු**



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

4. (A) (i) ප්‍රවේණික පරීක්ෂණ සඳහා ගෙවතු මෑවල ඇති අභිමත ගුණාංග **හතරක්** සඳහන් කරන්න.

- ප්‍රතිවිරුද්ධ ගති ලක්ෂණ(රාශියක්)සහිත ප්‍රභේද ගණනාවක් පැවතීම
- ජනන කාලය කෙටි වීම
- (සෑම මුහුමකදීම) ප්‍රජනිතයන්/විශාල සංඛ්‍යාවක් නිපදවීම
- ශාක අතර සිදුකරන මුහුම් (මුළුමනින්ම) පාලනය කළ හැකිවීම

**04pts**

(ii) (a) ප්‍රවේණි විද්‍යාවේදී බහුකාර්යතාව යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

එක් ජානයක ප්‍රකාශනය වීම එකිනෙක හා සම්බන්ධයක් නැති ගති ලක්ෂණ රාශියක ප්‍රකාශනය වීමට බලපෑම

**01pt**

(b) මිනිසාගේ දක්නට ලැබෙන බහුකාර්යතාව සඳහා නිදසුන් **දෙකක්** දෙන්න.

- සිස්ටික් ෆයිබ්‍රෝසිස්
- දෑකැති සෛල රෝගය/දෑකැති සෛල රක්තහීනතාවය

**02pts**

(iii) අන්තර්ජාන DNA සහ ඉන්ට්‍රෝන යනුවෙන් හැඳින්වෙන්නේ මොනවා ද?

අන්තර්ජාන **DNA :** ජාන අතර පිහිටන හඳුනාගත හැකි කෘත්‍යයක් නොමැති DNA කැබලි / නියුක්ලියොටයිඩ අනුක්‍රම /ප්‍රදේශ. /ජාන අතර පිහිටන නිර්කේත ප්‍රදේශ/ DNA කැබලි/ DNA අනුක්‍රම

ඉන්ට්‍රෝන **:** ජාන තුල පිහිටි නිර්කේත ප්‍රදේශ / DNA කැබලි / නියුක්ලියොටයිඩ අනුක්‍රම.

**02pts**

(iv) පහත දී ඇති එක් එක් ආබාධය සඳහා හේතු වන්නේ ත්‍රිදේහතාව ද, ඒකූනදේහතාව ද ජාන විකෘතිය ද යන්න දක්වන්න.

| ආබාධය | හේතුව |
|---|---|
| වර්ණ අන්ධතාව | ජාන විකෘති |
| ඩවුන් සහලක්ෂනය | ත්‍රිදේහතාවය |
| ටර්නර් සහලක්ෂනය | ඒකූණදේහතාව |

**03pts**

(v) (a) DNA විසංගමනයේදී පහත සඳහන් එක එකක් භාවිත කරන්නේ මන් දැයි සඳහන් කරන්න.

- තබරිය කාරක **:** DNase (ක්‍රියාකාරිත්වය)නිශේධනයට/ නියුක්ලියේස් (ක්‍රියාකාරීත්වය)සඳහා අවශ්‍ය වන ලෝහ අයන ඉවත් කිරීමට /
- ප්‍රෝටියොලිටික එන්සයිම: බැඳී ඇති ප්‍රෝටීන වලින් DNA නිදහස් කිරීමට/ DNA - ප්‍රෝටීන අණු බිඳ හෙළීමට/ නියුක්ලියොප්‍රෝටීන සංකීර්ණය බිඳහෙළීමට/
- සිසිල් එතනෝල් **:** DNA අවක්ෂේපනයට

**03pts**



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(b) ක්ලෝන වාහකයකුගේ අත්‍යවශ්‍ය ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

- Ori/ ප්‍රතිවලිත ආරම්භය
- බහු ක්ලෝනකරණ ස්ථාන / ... ක්ලෝනකරණ ස්ථාන
- සලකුණු (ජාන )

(ඕනෑම 02pts )

(B) (i) ප්‍රාථමික නිෂ්පාදනය යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?


නිශ්චිත ප්‍රදේශයක නිශ්චිත කාල සීමාවක් තුළ ස්වයංපෝෂීන් විසින් නිපදවනු ලබන කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය

( ආහාර x)

01 pt

(ii) (a) ශ්‍රී ලංකාවේ පහත දී ඇති එක් එක් පරිසර පද්ධතිය නිරූපණය කරනු ලබන්නේ රූපසටහනේ කුමන ඉලිප්සය මගින් දැයි නිවැරදි ඉංග්‍රීසි අක්ෂරය භාවිත කර දක්වන්න.

A – සැවානා
B – නිවර්තන කටු කැලෑ
C – තෙත් පතන
D – නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර




04pts

(b) ඉහත (ii)(a) හි සඳහන් පරිසර පද්ධති අතුරෙන් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ මෙන්ම අතරමැදි කලාපයේ දැකිය හැකි පරිසර පද්ධතිය කුමක් ද?

සවානා /A

01pt

(iii) ශ්‍රී ලංකාවේ නිවර්තන තෙත් පහතරට වැසි වනාන්තරවල දැකිය හැකි ඒකදේශික ශාකයක සාමාන්‍ය නම ලියන්න.

හොර

01pt

(iv) වනමය නෂ්ට වී යෑමට අතිශය ඉහළ අවදානමකට මුහුණ පා ඇති ශ්‍රී ලංකාවේ ශාකයක සාමාන්‍ය නම ලියන්න.

(වෙසක් ඕකිඩ්)/ ...

01pt

(v) (a) වායුගෝලයේ $CO_2$ ප්‍රමාණය අඩු කිරීමට වඩාත් ම දායක වන ජීවීන් කාණ්ඩය සඳහන් කරන්න.

ශාක ප්ලවාංග

01 pt

(b) ඉහත (v) (a) හි සඳහන් කරන ලද ජීවීන්ට බලපාන ප්‍රධාන ගෝලීය පරිසර ගැටළුව කුමක් ද?

ඕසෝන් ස්ථරය ක්ෂයවීම

( ... x) .

01pt



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(C) (i) (a) අනිවාර්ය නිර්වායු බැක්ටීරියා විශේෂයක් නම් කරන්න.

*Clostridium tetani / Clostridium botulinum/ Clostridium* sp.

**01pt**

(b) සයනොබැක්ටීරියාවලට ඒකයිනීවවල ඇති වැදගත්කම සඳහන් කරන්න.

අහිතකර පාරිසරික තත්ව යටතේදී/ අධික උෂ්ණත්වයේදී/ නියගවලදී නොනැසී පැවතීම/ ඔරොත්තු දීම/ ප්‍රතිරෝධීවීම.

**01pt**

(ii) (a) COVID–19 කොරෝනාවයිරසය දළ වශයෙන් ගෝලාකාර ය. එවැනි ගෝලාකාර වයිරස අයත් වන්නේ කුමන රූපීය ආකාරයට ද?

- ආවරිත (වයිරස)

**01pt**

(b) වයිරොයිඩයක් වයිරසයකින් ව්‍යුහාත්මක ලෙස වෙනස් වන්නේ කෙසේ ද?

ප්‍රෝටීන කොපුව/ කැප්සිඩය/ ආරක්ෂක ස්ථරය නොමැති වීම නිසා

**01pt**

(iii) උපජීකක එන්නත් භාවිතයෙන් ප්‍රතිශක්තිය ප්‍රේරණය කර ගත හැකි රෝග **දෙකක්** නම් කරන්න.

- පිටගැස්ම
- ගලපටලය
- හෙපටයිටිස් B

ඕනෑම **02pts**

(iv) පහත සඳහන් එක් එක් ද්‍රව්‍යය නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කළ හැකි ක්ෂුද්‍රජීවී විශේෂයක් බැගින් නම් කරන්න.

- සුක්‍රෝස් වලින් සිට්‍රික් අම්ලය : *Aspergillus niger*
- ඉන්වර්ටේස් : *Saccharomyces cerevisiae*
- ස්ට්‍රෙප්ටොමයිසින් : *Streptomyces griseus*/ ~~*Streptomyces* sp.~~

**03 pts**

(v) (a) ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරිත්වය නිසා ආහාර පූතිකරණය වීමේදී නිපදවෙන ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

- ඇමයිනෝ අම්ල
- ඇමීන
- ඇමෝනියා / $NH_3$
- හයිඩ්‍රජන් සල්ෆයිඩ් / $H_2S$

ඕනෑම **02pts**

(b) පරිභෝජනය සඳහා ජල සාම්පල නිතිපතා පරීක්ෂා කිරීමේදී ව්‍යාධිජනක ක්ෂුද්‍රජීවීන්ගේ පැවතීම වෙනුවට කෝලිෆෝම් බැක්ටීරියා වැනි සූචක ජීවීන්ගේ පැවතීම පරීක්ෂා කරන්නේ මන් ද?

- ව්‍යාධිජනකයන් ඉතා කුඩා සංඛ්‍යාවලින් පැවතිය හැකි වීම /ව්‍යාධිජනකයන් අනාවරණය කරගැනීමට නොහැකි විය හැකි වීම
- (ව්‍යාධිජනකයන් සිටින බව පරීක්ෂා කිරීමට) දීර්ඝකාලයක් ගතවීම

**02pts**

**40 pts x 2.5 = 100 ලකුණු**



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

WWW.ALEVELAPI.COM



## B කොටස – රචනා

5. උපස්තරය ලෙස ග්ලූකෝස් භාවිත කරමින් මිනිසාගේ අක්මා සෛල තුළ සිදු වන ස්වායු ශ්වසන ක්‍රියාවලිය විස්තර කරන්න.

සෛලීය ශ්වසන ක්‍රියාවලියේ ප්‍රධාන පියවර 03 කි.

1. ග්ලයිකොලිසිය.
2. පයිරුවේට් ඔක්සිකරණය සහ සිට්‍රික් අම්ල චක්‍රය/ ක්‍රෙබ්ස් චක්‍රය/ TCA චක්‍රය.
3. ඔක්සිකාරක පොස්ෆොරයිලීකරණය/ ඉලෙක්ට්‍රෝන පරිවහන දාමය.
4. ග්ලයිකොලිසිය (සෛලයක) සයිටොසොලය තුල සිදුවේ.
5. එය ඔක්සිජන් මත රඳා නොපවතී/ ඔක්සිජන් සහභාගී නොවේ.
6. (එක්) (6C) ග්ලූකෝස් අණුවක් (3 C) පයිරුවේට් අණු 2 ක් බවට ඔක්සිකරනය වේ. /බිඳ වැටේ
7. (ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා) ATP (අණු) දෙකක් වැය වේ. /භාවිත වේ.
8. $H^+$ 4 ක් ද, ඉලෙක්ට්‍රෝන ද නිපදවයි./ e → ඩිලු නැත.
9. ඒවා $NAD^+$ (අණු) 2 ක් මගින් ප්‍රතිග්‍රහණය කර
10. NADH (අණු) 2 ක් නිපදවයි. / ඇතිවේ.
11. (ග්ලයිකොලිසියේ පසු පියවර වලදී) ATP (අණු) 4ක් නිපදවන්නේ,
12. උපස්තර පොස්ෆොරයිලීකරණයෙනි.
13. ග්ලයිකොලිසියේ ශුද්ධ ATP ලාභය ATP (අණු) දෙකකි (ATP (අණු) 2 ක් වැය වන නිසා).
14. පයිරුවේට් (අණු) දෙක මයිටොකොන්ඩ්‍රියමට ඇතුළුවන්නේ,
15. සක්‍රිය පරිවහනයෙනි. /ශක්තිය වැය කිරීමෙනි /ATP වැය කිරීමෙනි
16. පයිරුවේට්, ඇසිටයිල් කාණ්ඩය බවට පරිවර්තනය වීමේදී $CO_2$ (අණු) 2ක් ද නිදහස් කරයි.
17. මෙය මයිටොකොන්ඩ්‍රියා පූරකය තුල සිදුවේ.
18. ඇසිටයිල් කාණ්ඩය, සහඑන්සයිම A සමග සම්බන්ධ වී ඇසිටයිල් සහඑන්සයිම A සාදයි.
19. (මෙම ප්‍රතික්‍රියාවේදී) $NAD^+$ (අණු) දෙකක්, NADH (අණු) දෙකක් බවට පත්වේ. / ඇතිවේ.
20. සිට්‍රික් අම්ල චක්‍රය/ ක්‍රෙබ්ස් චක්‍රය/ TCA චක්‍රය මයිටොකොන්ඩ්‍රියා පූරකය තුල (විශේෂිත එන්සයිම භාවිතයෙන්) සිදුවේ.
21. ඇසිටයිල් සහඑන්සයිම A, (4C) ඔක්සැලෝ ඇසිටික් අම්ලය/ ඔක්සැලෝ ඇසිටේට් සමග /OAA ප්‍රතික්‍රියා කර/ සම්බන්ධ වී (6C) සිට්‍රික් අම්ලය/ සිට්‍රේට් සාදයි.
22. සිට්‍රික් අම්ලය ප්‍රතික්‍රියා ශ්‍රේණියක් ඔස්සේ ගමන් කර ඔක්සැලෝ ඇසිටේට්/ ඔක්සැලෝ ඇසිටික් අම්ලය ප්‍රතිජනනය කරයි. /OAA
23. මෙහිදී (කාබොක්සිල්හරණයෙන්) $CO_2$ (අණු) දෙකක් ද, → එක් ග්ලූකෝස් අණුවක් භාවිත වන විට $4CO_2$
24. එක් ATP අණුවක්ද, 2ATP
25. උපස්තර පොස්ෆොරයිලීකරණයෙන් නිපදවේ.
26. එක් $FADH_2$ (අණුවක්) ද, $2FADH_2$



Visit EDUHUB විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

27. NADH (අණු) 3 ක් ද නිපදවේ. (මෙය චක්‍රය එක් වරක් සිදුවීමේදී/ එක් ඇසිටයිල් සහඑන්සයිම A (අණුවක්) සඳහා ය.)

28. එක් ග්ලූකෝස් අණුවක් සඳහා මෙම සංඛ්‍යා දෙගුණ විය යුතුයි.

29. මයිටොකොන්ඩ්‍රියා පටලයේ /මියරවල සිදුවන, ඉලෙක්ට්‍රෝන පරිවහන දාමයේදී

30. ATP නිපදවන්නේ,

31. ඔක්සිහරණය වූ සහඑන්සයිම / NADH සහ $FADH_2$ ඔක්සිකරණයෙනි .

32. මෙම ක්‍රියාවලිය ඔක්සිකාරක පොස්ෆොරයිලීකරණයයි.

33. (ඔක්සිහරණය වූ සහඑන්සයිමවල) ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටීන හා ප්‍රෝටීන නොවන අණු ශ්‍රේණියක් ඔස්සේ ගමන් කර

34. අවසානයේ දී අණුක ඔක්සිජන්/ $O_2$ මගින් ප්‍රතිග්‍රහණය කරයි/ $O_2$ අවසාන ඉලෙක්ට්‍රෝන ප්‍රතිග්‍රාහකයා වේ.

35. එක් NADH (අණුව) කින් ATP අණු 2.5 ක් ද,

36. එක් $FADH_2$ (අණුව) කින් ATP අණු 1.5 ක් ද නිපද වේ.

37. ඉලෙක්ට්‍රෝන පරිවහන දාමය තුළදී නිපදවෙන මුළු ATP අණු සංඛ්‍යාව 28 කි.

38. (මේ නිසා අක්මා සෛලයක් තුල) ග්ලූකෝස් අණු එකක් (ස්වායු ශ්වසනයට භාජනය වීමෙන්) නිපදවෙන මුළු ATP අණු සංඛ්‍යාව 32 කි.

| | |
|---|---|
| ඕනෑම 37 x 4 ලකුණු | = 148 |
| > 37 නිවැරදි නම් ලකුණු | = + 02 |
| මුළු ලකුණු | = 150 |

6. (a) ශාක කෙරෙහි ආලෝකයේ බලපෑම් විස්තර කරන්න.

1. ආලෝකය. ශාකයක වර්ධන හා විකසන ක්‍රියාවලියේදී වැදගත් සිදුවීම් බොහොමයක් ප්‍රේරණය කරයි.
2. ~~ඒ සියල්ල එක්ව ගත් විට~~ ප්‍රභාරූපජනනය ලෙස හැඳින්වේ.
3. ශාකවලට ආලෝක ප්‍රතිග්‍රහනය මගින් ඍතු හා
4. දින මැන ගැනීමට හැකියාව ඇත.
5. ශාක විසින් ආලෝක සංඥා,
6. ආලෝකය ලැබෙන දිශාව,
7. ආලෝක තීව්‍රතාවය සහ
8. තරංග ආයාමය /වර්ණ යනාදිය හඳුනා ගනී.
9. රතු හා නිල් ආලෝකය ප්‍රභාරූපජනනයට වඩාත් වැදගත් වර්ණයන්ය.

ශාකවල ප්‍රධාන ප්‍රභා ප්‍රතිග්‍රාහක ආකාර දෙකකි.

10. ෆයිටක්‍රෝම් ප්‍රභා ප්‍රතිග්‍රාහක,
11. (ප්‍රධාන වශයෙන්) රතු ආලෝකය අවශෝෂණය කරයි.
12. නිල් ආලෝකයට අදාල ප්‍රභා ප්‍රතිග්‍රාහක,
13. ප්‍රභාවර්තනය ආරම්භ කරයි.
14. පුටිකා විවර වීම හා




Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

7. (*a*) මිනිස් ඇසේ මූලික ව්‍යුහය කෙටියෙන් විස්තර කරන්න.

1. බාහිර තන්තුමය ස්තරය,
2. ශ්වේතසන ස්තරයෙන් සහ ස්වච්ඡයෙන් සමන්විත වේ.
3. මධ්‍ය වාහිනීමත් ස්තරය,
4. රුධිර ග්‍රාහිය, ප්‍රතියෝජක දේහය සහ තාරා මණ්ඩලයෙන් සමන්විත වේ.
5. ඇතුළු ස්නායුක ස්තරය,
6. දෘෂ්ටි විතානයයි.
7. කාචය, අම්මය රසය, හා කාච රසය අක්ෂි ගෝලය තුල අන්තර්ගත වේ.
8. ශ්වේත සන ස්තරය පාරාන්ධය/ සුදු පැහැතිය.
9. ස්වච්ඡය පැහැදිලිය/ පාරදෘශ්‍යය
10. රුධිර වාහිනී රහිතය.
11. (තුනී) රුධිර ග්‍රාහිය වර්ණක සහිතය.
12. රුධිර වාහිනී බහුලය.
13. ප්‍රතියෝජක දේහය සිනිඳු පේශි තන්තු/ ප්‍රතියෝජක පේශි වලින් සමන්විත වේ.
14. තාරා මණ්ඩලය වර්ණවත්ය/ වර්ණක සහිත සෛල වලින් සමන්විතය.
15. එහි සිනිඳු පේශි තන්තු ස්තර 2 ක් ඇත/ වෘත්තාකාර හා අරීය ගොනු ඇත.
16. කාචය ප්‍රත්‍යස්ථය,
17. ද්වි උත්තල සහ
18. පාරදෘශ්‍යය.
19. අම්මය රසය පැහැදිලිය/ ජලීය වේ.
20. කාච රසය අවර්ණ ය/ පාරදෘශ්‍යය/ ජෙලි වැනි ව්‍යුහයකි (කාචයට පිටුපසින්)
21. දෘෂ්ටි විතානයේ ප්‍රකාශ ප්‍රතිග්‍රාහක/ යෂ්ටි හා කේතු අන්තර්ගත වේ.

ඇසේ රූප සටහන




සම්පූර්ණයෙන් නම් කරන ලද රූප සටහන ලකුණු - 06

අර්ධ ලෙස නම් කරන ලද රූප සටහන ලකුණු - 03

නම් නොකරන ලද රූප සටහනට ලකුණු නැත



Visit EDUHUB ... විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

15. බීජාධරය දික්වීම නිෂේධනය/ සෙමෙන් සිදුවේ.

16. ධන ප්‍රභාවර්තනය / ප්‍රරෝහය ආලෝකය දෙසට වර්ධනය වීම මගින්, ප්‍රභාසංශ්ලේෂණය වඩා ශක්තිමත් කරයි.

17. ෆයිටක්‍රෝම් (ප්‍රභා ප්‍රතිග්‍රාහක) මගින් ශාක ආලෝකයට දක්වන ප්‍රතිචාර සහ

18. බීජ ප්‍රරෝහනය යාමනය කරයි.

19. සමහර බීජ (ආසන්න) ප්‍රශස්ත ආලෝක තත්වය ලැබෙන තුරු සුප්තව පවතී.

20. ෆයිටක්‍රෝම් මගින් ආලෝකයේ තත්වය පිළිබඳ ශාකයට තොරතුරු ලබාදෙයි.

21. එමගින් ශාකයට (පිටත ඇති) ආලෝක තත්වයේ වෙනස්වීම්වලට අනුවර්තනය විය හැකිය.

22. උදා :- සෙවන මග හැරීම.

23. ශාක පරතරය පවත්වා ගැනීම.

24. ආලෝකයට සෘජුවම නිරාවරණය වීමෙන් අතු බෙදීම උත්තේජනය සහ

25. ශාකයේ උස වැඩිවීම නිෂේධනය වේ.

26. ප්‍රකාශ අවධිය (බොහෝ ශාකවල) පුෂ්ප හට ගැනීම පාලනය කරයි.

(*b*) උපරිම ආලෝක ප්‍රමාණයක් ලබාගැනීම සඳහා ශාක හැඩ ගැසී ඇති ආකාරය පැහැදිලි කරන්න.

1. යාබද ශාකවලින් ඇතිවන සෙවන මග හැරීම සඳහා ශාක උසට වර්ධනය වේ.
2. බොහෝමයක් උස ශාකවලට සනකම් කඳක්/ ශක්තිමත් යාන්ත්‍රික සන්ධාරනයක් ඇත.
3. (කාෂ්ඨීය) ශාකවල (උස) කඳන් ද්විතියික වර්ධනය නිසා වඩාත් ශක්තිමත් වේ.

4. [illegible]

5. ~~4.~~ ශාක අතු බෙදීමේ රටා, (උපරිම අලෝක ප්‍රමාණයක් අවශෝෂණය කර ගැනීමට හැඩ ගැසී ඇත.)

6 ~~5.~~ ශාක පත්‍රයේ ප්‍රමාණය එය වැඩෙන ස්ථානය අනුව වෙනස් වේ.

7 ~~6.~~ වර්ෂා වනාන්තර තුල වැඩෙන ශාකවලට විශාල පත්‍ර ඇත.

~~7. වියළි/ ඉතා ශීත පරිසරවල වැඩෙන ශාකවලට කුඩා පත්‍ර ඇත.~~

8. කඳ මත පත්‍ර සැකසී ඇති ආකාරය/ පත්‍ර වින්‍යාසය (උපරිම අලෝක ප්‍රමාණයක් ග්‍රහණයට ශාකවලට ආධාර වේ.)

9. ගැටයකට පත්‍ර එකක්, දෙකක් හෝ කිහිපයක් සවිවී තිබීම.

10. පත්‍ර දිශානතිය,

11. සමහර පත්‍ර තිරස්ව සකස්ව පවති.

12. එවිට අඩු අලෝක තත්ව යටතේ වුවද ඒවා කාර්යක්ෂමව ආලෝකය ග්‍රහනය කරයි.

~~13. සමහර පත්‍ර/ තෘණ ශාක පත්‍ර සිරස්ව සැකසී ඇත.~~

~~14. මෙලෙස පත්‍ර සැකසී ඇත්තේ තීව්‍ර ආලෝකයට නිරාවරණය වීමෙන් පත්‍ර තලයට සිදුවිය හැකි හානිය මග හරවා ගැනීමටයි.~~

| | |
|---|---|
| **26 + ~~14~~ 12** | **= ~~40~~ 38** |
| **ඔනෑම 37 x 4 = ලකුණු** | **= 148** |
| **> 37 නිවැරදි නම් ලකුණු** | **= + 02** |
| **<u>උපරිම ලකුණු</u>** | **= <u>150</u>** |



සියලුම ජීව විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(*b*) දෘෂ්ටියේදී මිනිස් ඇසේ සහ මොළයේ කාර්යභාරයන් පැහැදිලි කරන්න.

1. (වස්තුවෙන් පැමිණෙන) ආලෝක කිරණ වැඩියෙන්ම වර්තනය කරන්නේ කාචය මගිනි
2. එක් එක් ඇසෙහි දෘෂ්ටි විතානය මත පැහැදිලි ප්‍රතිබිම්බයක් නාභිගත කරයි.
3. එය යටිකුරුය.
4. අක්ෂි පටලය, ස්වච්ඡය, අම්මය රසය හා කාච රසය ආලෝක වර්තනය සඳහා දායක වේ. (ලකුණු ගැනීම සඳහා ඕනෑම තුනක් ලිවිය යුතුය)
5. (පැහැදිලි) ලඟ දෘෂ්ටිය සඳහා වර්තනය වැඩි කර ගැනීමට ඇස සකස් කරගන්නේ,
6. ස්වයං සාධක ස්නායු පද්ධතියේ පාලනය යටතේය.
7. අක්ෂි ගෝලයට සම්බන්ධ පේෂි මගින් ඇස කරකවා,
8. දෘෂ්ටි විතානයේ අදාල ප්‍රදේශය මත ආලෝක කිරණ නාභිගත කරයි/ අභිසාරීතාවය දක්වයි.
9. ලඟ දෘෂ්ටිය සඳහා (ලඟ ඇති වස්තුවක් දෘෂ්ටි විතානය මත නාභිගත වීමේදී) කාචයේ උත්තල භාවය/ වක්‍රතාවය වෙනස් කරනු ලබන්නේ/ වැඩිකරන්නේ,
10. ප්‍රතියෝජක පේශි සංකෝචනයෙනි/ ප්‍රතියෝජනය මගිනි.
11. දුර දෘෂ්ටියේදී (දුරින් ඇති වස්තුවක් දෘෂ්ටි විතානය මත නාභිගතවීමේදී) කාචයේ උත්තල භාවය/ වක්‍රතාවය අඩු කරන්නේ,
12. (ඇසේ) ප්‍රතියෝජක පේෂි ඉහිල්වීම මගිනි.
13. දෘෂ්ටි විතානයේ ඇති ප්‍රකාශ ප්‍රතිග්‍රාහක සෛල මගින් ආලෝක ශක්තිය විභව වෙනසක් බවට පත් කරයි.
14. යෂ්ටිවල උත්තේජය කළු-සුදු දෘෂ්ටියට සහ
15. රාත්‍රි දෘෂ්ටියට වැදගත් වේ.
16. කේතුවල උත්තේජනය මගින් වර්ණ දෘෂ්ටිය ලැබේ.
17. දෘෂ්ටි විතානයේ ඇති ද්වි ධ්‍රැව සෛල ප්‍රකාශ ප්‍රතිග්‍රාහක සෛලවලින් විද්‍යුත් සංඥා ලබාගෙන,
18. ගැංග්ලියා සෛලවලට යවයි.
19. දෘෂ්ටික ස්නායු(තන්තු) එම ආවේගය/ ක්‍රියා විභවය/ සම්ප්‍රේෂණය කරන්නේ,
20. (මස්තිෂ්කයේ) අපරකපාල කණ්ඩිකාවටය.
21. මොළය/එම දෘෂ්ටි වස්තුව නිවැරදි ආකාරයට/ උඩුකුරු ලෙසට සංජානනය කරයි/

| | | |
|---|---|---|
| **21+ 21** | = | **42** |
| ඕනෑම **36 x 4 =** | = | ලකුණු **144** |
| රූප සටහන් සඳහා ලකුණු | = | **06** |
| මුළු ලකුණු | = | **150** |

Vidusala EDUHUB විද්‍යා/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

8. ස්ත්‍රීන්ගේ ඔසප් චක්‍රය සහ එහි හෝමෝනමය යාමනය විස්තර කරන්න.

1. ගර්භාෂය තුල සිදුවන වෙනස්කම් වලින් සමන්විත,
2. මාසයකට වරක්/ දින 28 කට වරක්
3. කාන්තාවකගේ ප්‍රජනන කාලය තුල සිදුවන,
4. සියලු චක්‍රීය වෙනස්වීම්/ ඩිම්බකෝෂ චක්‍රය මගින් යාමනය වේ -

ඔසප් චක්‍රය සමන්විත වන්නේ.

5. ප්‍රගුණන කලාව,
6. ස්‍රාවීය කලාව,
7. ආර්තව කලාව යන ඒවායිනි.

ප්‍රගුණන කලාව

8. ඩිම්බකෝෂ චක්‍රයේ ස්‍යූනික අවධිය සමග, සම්බන්ධීකරණය වේ.
9. ඩිම්බ මෝචනයට පෙර සිදුවේ.
10. ඩිම්බකෝෂයේ වර්ධනය වන ස්‍යූනිකා මගින්,
11. ස්‍රාවය කරනු ලබන එස්ට්‍රඩියෝල්/ ඊස්ට්‍රජන් මගින්
12. කලලයට ආධාර කිරීම/ අධිරෝපනය සඳහා ගර්භාෂය සකස් කිරීම සිදු කරයි.
13. ඒ (ගර්භාෂයේ) එන්ඩොමෙට්‍රියම සණකම් කිරීම උත්තේජනය කිරීම මගිනි

ස්‍රාවීය කලාව

14. ඩිම්බකෝෂ චක්‍රයේ ලූටීය අවධිය සමග සම්බන්ධීකරණය වේ.
15. ඩිම්බ මෝචනයෙන් පසු ආරම්භ වේ.
16. පීත දේහයෙන් ස්‍රාවය කරනු ලබන
17. ඊස්ට්‍රඩියෝල්/ ඊස්ට්‍රජන් සහ
18. ප්‍රොජෙස්ටරෝන් මගින්
19. ගර්භාෂයික ආස්තරයේ පැවැත්ම උත්තේජනය/ දිරි ගැන්වීම කරනු ලබන අතර,
20. එය තව දුරටත් විකසනය කරයි.
21. ධමනි විශාල වීමෙන්,
22. සහ එන්ඩොමෙට්‍රියමේ ග්‍රන්ථි වර්ධනය වීම මගිනි.
23. එමගින් නිපදවන පෝෂක ස්‍රාවයන්,
24. අධිරෝපනය සිදු වූවහොත් (ළපටි) කලලය පවත්වාගනී.

ආර්තව කලාව


25. (කලලයක්) අධිරෝපනය සිදු නොවූනහොත්, ඩිම්බ කෝෂ හෝමෝන/ ඊස්ට්‍රඩියෝල්/ ඊස්ට්‍රජන් හා ප්‍රොජෙස්ටරෝන්, සාන්ද්‍රණය අඩු වන්නේ,
26. පීත දේහය පිරිහීයාම නිසාය.
27. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගර්භාෂ ආස්තරයේ ධමනි සංකුචනය වී,
28. ගර්භාෂයික ආස්තරණය බිඳ වැටේ.
29. මේ නිසා එන්ඩොමෙට්‍රියම් පටක,



විද්‍යා/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

30. තරලය ද සමග ගර්භාෂයෙන් ගැලවී යයි.
31. ආර්තව ප්‍රවාහය දින කිහිපයක් පවතී.
32. ගර්භාෂයික ගෙල සහ
33. යෝනි මාර්ගය ඔස්සේ සිදුවේ.
34. මෙය ආර්තවය ලෙස හැඳින්වේ.
35. ඊළඟ ආර්තව චක්‍රය ආරම්භ වීම ඩිම්බකෝෂ චක්‍රයේ ස්‍යුනික අවධියේදී,
36. නව ස්‍යුනිකාවක් වර්ධනය වීමත් සමග ආරම්භ වේ.

**36 x 4 = ලකුණු =144**




රූප සටහන්

රුධිරයේ ඊස්ට්‍රඩියෝල් සහ ප්‍රෙජෙස්ටරෝන් හෝමෝන වෙනස් වන ආකාරය - ලකුණු = 03
එන්ඩොමෙට්‍රියමේ දළ වෙනස්වීම් ලකුණු = 03

මුළු ලකුණු = **150**

9. (*a*) කෘෂිකර්මයේදී ක්ෂුද්‍රජීවීන්ගේ යොදා ගැනීම් කෙටියෙන් විස්තර කරන්න.

1. ජෛව පොහොර ලෙස භාවිතා කරයි.
2. ඒ නයිට්‍රජන් (N) හා
3. පොස්ෆරස් (P) හි ජෛව ප්‍රයෝජ්‍යතාවය ඉහල නැංවීමටය.
4. පාංශු ද්‍රාවණයේ පොස්ෆේට් ද්‍රාව්‍යතාවය දියුණු කරයි/ ඉහල නංවයි.
5. ඒ කාබනික අම්ල ස්‍රාවය කිරීමෙනි.
6. එමගින් පොස්ෆරස් සහිත ඛනිජ දිය කර,
7. පොස්ෆේට් අයනවල කැටායන නබර සහකරුවන් සාදයි.
8. නයිට්‍රජන් තිර කිරීමට දායක වීම.
9. සහජීවීව/ සහජීවී නයිට්‍රජන් තිර කිරීම.



විද්‍යා/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

10. උදා : රනිල ශාක තුල ජීවත් වන *Rhizobium*(sp)/ ජලජ පර්ණාංග/ *Azolla* තුල ජීවත් වන *Anabaena*(sp.)
11. නිදැලිවාසී නයිට්‍රජන් තිර කිරීම (පස තුල/ මූල ගෝලයේ)
12. උදා : - *Azotobacter*
13. ශාක වර්ධනය වැඩි දියුණු කරයි.
14. ඒ ශාක වර්ධක ද්‍රව්‍ය ස්‍රාවය කිරීමෙනි.
15. උදා : - ඔක්සින /ඉන්ඩෝල් - 3 - ඇසිටික් ඇසිඩ් / සයිටොකයිනින්/ ගිබරිලින්
16. ජෛව පළිබෝධනාශක ලෙස භාවිතා කරයි.
17. කීට ව්‍යාධිජනක, දිලීර/ බැක්ටීරියා/ *Bacillus thuringiensis.* / BtI
18. කොම්පොස්ට් සෑදීමේදී යොදාගනී.
19. උදා :- තාපකාමී බැක්ටීරියා/ කාබනික ද්‍රව්‍ය බිඳ හෙලන බැක්ටීරියා/ ප්‍රොටොසෝවා/ දිලීර/ ඇක්ටිනොමයිසිටීස්.

(*b*) පොලිමරේස් දාම ප්‍රතික්‍රියාවේ (PCR) භාවිත පැහැදිලි කරන්න.

1. සායනික නිදර්ශක/ නිදර්ශක විශ්ලේෂණයට භාවිතා කරන්නේ,
2. ආසාදන කාරක තිබේදැයි හඳුනා ගැනීම සඳහාය,
3. උදා: HIV/ හෙපටයිටිස්/මැලේරියා/ COVID 19 වැනි (ආසාදන කාරක) යි. /කොරෝනා වෛරස
4. ප්‍රවේණික රෝග ඇති කරන විකෘති විශ්ලේෂණය සඳහා ද භාවිත වේ.
5. උදා : - සිස්ටික් ෆයිබ්‍රෝසිස්/ දෑකැති සෛල රක්ත හීනතාවය/ ෆීනයිල් කීටොයූරියා
6. ව්‍යවහාරික පරීක්ෂණාගාරවල භාවිතා කරන්නේ,
7. (අච්චු) DNA කුඩා සංඛ්‍යාවකින් පිටපත් විශාල සංඛ්‍යාවක් සෑදීමට PCR ට හැකි බැවිනි.
8. ක්ලෝනීකරණයේදී භාවිතා කරන්නේ,
9. (ඉතා කුඩා අච්චු DNA ප්‍රමාණයකින්) ශුද්ධ DNA විශාල ප්‍රමාණයක් නිපදවීමට හැකි බැවිනි.
10. DNA අනුක්‍රම නිර්ණයට භාවිතා කරයි.
11. පරිණාමික ජීව විද්‍යාවේදී භාවිතා කෙරේ.
12. ඒ විශේෂ අතර සබඳතා හඳුනාගැනීමට/ගවේෂණයට යි.
13. මානව විද්‍යාවේදී භාවිතා කරන්නේ,
14. පුරාතන මානව සංක්‍රමණ රටා හඳුනා ගැනීමටයි.
15. පුරාවිද්‍යාවේදී භාවිත කරන්නේ
16. පුරාතන මානව වර්ගයා පිළිබඳ සොයා බැලීමටය.
17. පාෂාණධාතු විද්‍යාවේදී භාවිතා කරන්නේ,
18. නෂ්ට වූ විශේෂවලින්/ අධිශීත සංරක්ෂිත ෆොසිල වලින් ලබා ගත් DNA ප්‍රගුණනය කර
19. පරිණාමික බන්ධුතා පැහැදිලි කිරීම සඳහාය.

| | | |
|---|---|---|
| 19 + 19 | = | 38 |
| ඕනෑම 37 x 4 = | = | ලකුණු 148 |
| > 37 නිවැරදි නම් ලකුණු | = | + 02 |
| මුළු ලකුණු | = | **150** |



ජීව විද්‍යා/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**10.** පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(*a*) ශ්‍රී ලංකාවේ ලවණ වගුරු

1. ශුෂ්ක,
2. වෙරළ බඩ ප්‍රදේශ වල හමුවේ
3. වියළි කාලයේදී පස වියළි වී
4. ලවණ ස්ඵටික සෑදේ.
5. අඩු වර්ෂාපතනය.
6. අධික සුළං.
7. ඉහළ උෂ්ණත්වය.
8. බුරුල් වැලි.
9. ලවණ සමග වැලි සුළඟට ගසාගෙන යයි.
10. ශාක විශේෂ ස්වල්පයකි/ කිහිපයකි.
11. ශාක මිටි ය,
12. මාංසල දේහ සහිතය.
13. සත්ව විශේෂ ස්වල්පයකි/ කිහිපයකි.
14. පුත්තලම/ මන්නාරම/ හම්බන්තොට/ වාකරේ යන (ප්‍රදේශ වල) හමුවේ.

(*b*) අපිප්‍රවේණිය

1. DNA අනුක්‍රමය/ ප්‍රවේණික කේතය හැර අනෙක් සාධක මගින් පාලනය කරන (නිශ්චිත ලක්ෂණයට අදාල) නිශ්චිත රූපාණු දර්ශ ඇතිවීම./
   DNA අනුක්‍රමය/ ප්‍රවේණි කේතය හැර වෙනත් සාධක මගින් නිශ්චිත ලක්ෂණ පාලනය කිරීම.
2. ඇතැම් ජාන සක්‍රිය කිරීම හා
3. අක්‍රිය කිරීම නිසා මෙය සිදුවන්නේ,
4. DNA අනුක්‍රමයේ නියුක්ලියෝටයිඩ විකරණය කිරීම මගිනි.
5. මෙය මෙතිලීකරණය මගින්/මෙතිල් කාණ්ඩ එකතු කිරීමෙන්,
6. ඩීමෙතිලීකරණය මගින් /මෙතිල් කාණ්ඩ ඉවත් කිරීමෙන් සිදුවේ.
7. DNA අනුක්‍රමයකට අදාළ විකරණය වූ ප්‍රකාශනයක් ප්‍රතිඵල කරයි.
8. අපිප්‍රවේණිය ඇති වන්නේ ආවේනික සංඥා/ ආවේණිය/ අපිප්‍රවේණික ආවේණිය හෝ
9. පාරිසරික සාධක හේතුවෙනි.
10. උදා: - පිළිකා.
11. පරිසරයෙන් ලැබෙන උත්තේජ/ පාරිසරික සාධක නිසා අපිප්‍රවේණික ආවේණිය ප්‍රතිවර්තය විය හැකිය.
12. උදා : - භින්නෝන්මාදය.



විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(c) ඇස්කොමයිකෝටාවල ප්‍රජනනය

1. අලිංගික හා
2. ලිංගික ප්‍රජනනය පෙන්වයි.
3. අලිංගික ප්‍රජනය කොනීඩියා මඟිනි.
4. කොනීඩිධරයන්හි (අග්‍රස්ථයේ) නිපදවයි.
5. ඒවා විශේෂිත හයිෆාවන්ය/ දීලිර සූත්‍රිකාවන්ය.
6. ලිංගික ප්‍රජනය ජන්මානුධානි මඟිනි.
7. ඒවා ලිංගික විභේදනය වී ඇත.
8. ඒවා හා වීමෙන්,
9. අස්කස නිපදවයි.
10. ඒවා තුළ අස්කබීජාණු අන්තර්ගත වේ/ අස්කස තුළ අස්ක බීජාණු නිපදවයි.
11. සෑම අස්කසයක් තුළම අස්ක බීජාණු 08 ක් පවතී.
12. අස්කඵල තුල අස්කස පවතී.

ඩෙංගු වාහකයාගේ ජෛව විද්‍යාත්මක පාලනය

1. (කීට භක්ෂක) මත්ස්‍යයන් යොදා ගැනීම.
2. උදා : - ගප්පි/ දණ්ඩි/ තිලාපියාගේ කුඩා අවධි.
3. ඔවුන් මදුරු කීටයන් ආහාරයට ගනී/ මදුරු කීටයන් පාලනය කරයි.
4. *Bacillus thuringiensis*/ *Bti* භාවිතා කිරීම. BtI
5. එය අන්තඃධූලකයක් නිපදවයි.
6. මෙය (මදුරු) කීටයන්ට විෂ වේ.
7. ජෛව විද්‍යාත්මක පාලනයේ සීමා/අවාසි ස්වල්පයක් පවතී.
8. මත්ස්‍යයින් මිය යා හැක.
9. ඒ ආහාර නැති වීම
10. ජලයේ ගුණාත්මක තත්ව වෙනස් වීම
11. ක්ලෝරීන් සහිත ජලය එක් කිරීම නිසාය.
12. සමහර ස්ථාන වලට *Bacillus thuringiensis*/ *Bti* යොදාගත නොහැකිය.

| | | |
|---|---|---|
| 14 + 12 + 12 | = | 38 |
| ඕනෑම 37 x 4 = | = | ලකුණු 148 |
| > 37 නිවැරදි නම් ලකුණු | = | + 02 |
| මුළු ලකුණු | = | 150 |



විද්‍යා/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**10.** පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(*a*) ශ්‍රී ලංකාවේ ලවණ වගුරු

1. ශුෂ්ක,
2. වෙරළ බඩ ප්‍රදේශ වල හමුවේ
3. වියළි කාලයේදී පස වියළි වී
4. ලවණ ස්ඵටික සෑදේ.
5. අඩු වර්ෂාපතනය.
6. අධික සුළං.
7. ඉහළ උෂ්ණත්වය.
8. බුරුල් වැලි.
9. ලවණ සමඟ වැලි සුළඟට ගසාගෙන යයි.
10. ශාක විශේෂ ස්වල්පයකි/ කිහිපයකි.
11. ශාක මිටි ය,
12. මාංසල දේහ සහිතය.
13. සත්ව විශේෂ ස්වල්පයකි/ කිහිපයකි.
14. පුත්තලම/ මන්නාරම/ හම්බන්තොට/ වාකරේ යන (ප්‍රදේශ වල) හමුවේ.

(*b*) අපිප්‍රවේණිය

1. DNA අනුක්‍රම්ය/ ප්‍රවේණික කේතය හැර අනෙක් සාධක මගින් පාලනය කරන (නිශ්චිත ලක්ෂණයට අදාල) නිශ්චිත රූපාණු දර්ශ ඇතිවීම./
   DNA අනුක්‍රමය/ ප්‍රවේණි කේතය හැර වෙනත් සාධක මගින් නිශ්චිත ලක්ෂණ පාලනය කිරීම.
2. ඇතැම් ජාන සක්‍රිය කිරීම හා
3. අක්‍රිය කිරීම නිසා මෙය සිදුවන්නේ,
4. DNA අනුක්‍රමයේ නියුක්ලියෝටයිඩ විකරණය කිරීම මගිනි.
5. මෙය මෙතිලීකරණය මගින්/මෙතිල් කාණ්ඩ එකතු කිරීමෙන්,
6. ඩීමෙතිලීකරණය මගින් /මෙතිල් කාණ්ඩ ඉවත් කිරීමෙන් සිදුවේ.
7. DNA අනුක්‍රමයකට අදාළ විකරණය වූ ප්‍රකාශනයක් ප්‍රතිඵල කරයි.
8. අපිප්‍රවේණිය ඇති වන්නේ, ආවේනික සංඥා/ ආවේණිය/ අපිප්‍රවේණික ආවේණිය හෝ
9. පාරිසරික සාධක හේතුවෙනි.
10. උදා: - පිළිකා.
11. පරිසරයෙන් ලැබෙන උත්තේජ/ පාරිසරික සාධක නිසා අපිප්‍රවේණික ආවේණිය ප්‍රතිවර්ත්‍ය විය හැකිය.
12. උදා : - භින්නෝන්මාදය.



විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.